# සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත

## 2008 අංක 35

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 2008 ඔක්තෝබර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 ඔක්තෝබර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිළ : රු. 35.00 යි. තැපැල් ගාස්තුව : රු. 12.50 යි.



[සහතිකය සටහන් කළේ 2008 ඔක්තෝබර් මස 23 වන දින]

එල්. ඩී. — ඕ. 11/2006.

ශ්‍රී ලංකා දේශීය ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයක හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය හෝ දූෂණය වැළැක්වීම, පාලනය කිරීම සහ අවම කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඊ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

1. මේ පනත 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයේ දී එය ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම

*සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම.*

2. (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු අතර, එය 3 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව මේ පනතේ විධිවිධාන පරිපාලනය කිරීම සඳහා අධිකාරිය වගකිව යුතු ය.

(3) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් එයට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එම නාමයෙන් එය විසින් නඩු පැවරීම ද, එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි විය යුතු ය.

*අධ්‍යක්ෂ මණ්ඩලය.*

3. (1) අධිකාරියේ කටයුතුවල පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු අතර, එම මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අමාත්‍යවරයාගේ මතය අනුව, නාවික කටයුතු, වරාය මෙහෙයුම් හෝ සමුද්‍රීය දූෂණය වැළැක්වීමට අදාළ ක්ෂේත්‍රවල

පළපුරුද්දක් ඇත්තා වූ ද එම ක්ෂේත්‍ර පිළිබඳව නිපුණතාවයක් පෙන්වා ඇත්තා වූ ද අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන්නා වූ ද සාමාජිකයන් තිදෙනෙක් ;

(ආ) නිලබලයෙන් පත්වන අධ්‍යක්ෂවරුන් හත් දෙනෙක් එනම්—

(i) පරිසර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් තත්කාලයෙහි ධූර දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(ii) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් තත්කාලයෙහි ධූර දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(iii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් තත්කාලයෙහි ධූර දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(iv) ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් තත්කාලයෙහි ධූර දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(v) වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා ලෙස තත්කාලයෙහි ධූර දරන තැනැත්තා ;

(vi) ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික හමුදාපති වශයෙන් තත්කාලයෙහි ධූර දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(vii) අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් තත්කාලයෙහි ධූර දරන තැනැත්තා.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.



4. (1) යම් තැනැත්තෙක්— සාමාජිකයකු වශයෙන් පත්කිරීම සම්බන්ධව නුසුදුසුකම්.

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ වෙනත් යම් පළාත් පාලන ආයතනයක සභිකයකු නම් හෝ වුවහොත් ;

(ආ) ශ්‍රී ලාංකික පුරවැසියෙක් නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වුවහොත් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මක වන නීතියක් යටතේ වස්තුභංගත්වයට හෝ බංකොලොත් භාවයට පත් තැනැත්තකු ලෙස ප්‍රකාශිතව, නිදහස් කරනු නොලැබූ වස්තුභංගත්වයට පත් හෝ බංකොලොත් තැනැත්තකු නම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් හෝ තීරණය කරනු ලැබ ඇත්නම් ; හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටියේ නම් හෝ යටත්ව සිටී නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ එහි සාමාජිකයකු ලෙස නොකඩවා ධූරය දැරීමට හෝ නුසුදුස්සෙක් වන්නේ ය.

(2) 3 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ පිළිවෙලින් අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයන් සහ සභාපතිවරයා මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතු අතර නැවත පත් කිරීම සඳහා ද සුදුස්සකු වන්නේ ය.

(3) 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් සාමාජිකයකු—

(අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි දක්වා ඇති යම් නුසුදුසුකමකට යටත් වුවහොත් ; හෝ

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව, ශාරීරික අශක්තතාවය හෝ සිහිවිකල බව හේතුකොට ගෙන ඔහුගේ කාර්යය ඉටු කිරීමට ස්ථිරවම නොහැකි තත්ත්වයකට පත්වුවහොත් ; හෝ

(ඇ) අමාත්‍යවරයාගේ මතය අනුව, අධිකාරියට අපකීර්තියක් ඇතිවිය හැකි යම් ක්‍රියාවක් ඔහු විසින් කරනු ලැබුවහොත්,

අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධිකාරියේ සභාපතිවරයා විසින් හෝ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද වෙනත් යම් සාමාජිකයකු විසින් හෝ ධුරය හිස්කරනු ලැබුවහොත්, නැතහොත් ඉහතින් වූ උපවගන්තියේ විධිවිධාන යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, තම අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය සඳහා ඒ ධුරය දැරීමට මණ්ඩලයේ නිර්දේශ මත වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(5) 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත්කරන ලද මණ්ඩලයේ සභාපතිවරයා හෝ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් සාමාජිකයකු රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මාස තුනකට නොවැඩි කාලයක් තම ධුරයේ කාර්යය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ සාමාජිකයා වශයෙන් කටයුතු කිරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(6) 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සභාපතිවරයා හෝ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද වෙනත් යම් සාමාජිකයකු විසින් තත්කාර්ය සඳහා අමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ සාමාජිකයා වශයෙන් වූ තම ධුරයෙන් කවර හෝ අවස්ථාවක ඉල්ලා අස්විය හැකි ය.

(7) මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් ආකාරයකට යම් අනුප්‍රමාණ අනුව 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සභාපතිවරයා සහ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සෑම සාමාජිකයකුට ම අධිකාරියේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.



(8) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු විසින් මණ්ඩලයේ සෑම රැස්වීමක ම මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් පැමිණ සිටින සාමාජිකයන් අතුරින් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(9) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(10) මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(11) මණ්ඩලය මගින් නියම කරනු ලැබිය හැකි ස්ථානයක දී හා යම් වේලාවක දී අවම වශයෙන් මසකට වරක් හෝ මණ්ඩලයේ රැස්වීම් පවත්වනු ලැබිය යුතු ය.

(12) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ එහි සාමාජිකයන්ගේ පත්වීම සම්බන්ධයෙන් යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

5. (1) අධිකාරියේ මුද්‍රාව— අධිකාරියේ මුද්‍රාව.

(අ) සභාපතිවරයා හෝ තත්කාර්ය සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද සාමාජිකයකු භාරයේ තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ;

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සංඥාවක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

(2) අධිකාරියේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර හා ලේඛන පිළිබඳව ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගනු ලැබිය යුතු ය.

## II වන කොටස

## අධිකාරියේ කර්තව්‍ය

**අධිකාරියේ කර්තව්‍ය.**

6. අධිකාරියේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය:—

(අ) මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග ඵලදායී ලෙසත් කාර්යක්ෂම ලෙසත් පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ආ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත කාර්යයන්ගෙන් සහ වෙරළ ආශ්‍රිත සමුද්‍රය සම්බන්ධ කාර්යයන්ගෙන් දූෂණය වීම වැළැක්වීම, අඩු කිරීම, පාලනය කිරීමේ සහ කළමනාකරණ කාර්යයන් සඳහා වූ යෝජනා ක්‍රමයක් සකස් කිරීම සහ ක්‍රියාවට යෙදවීම ;

(ඇ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත යම් කටයුත්තකින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන දූෂණයවීම වැළැක්වීමේ, අවම කිරීමේ, පාලනය කිරීමේ හෝ කළමනාකරණය කිරීමේ කාර්ය සඳහා වෙනත් දෙපාර්තමේන්තු, නියෝජිතායතන සහ රජයේ සහ පෞද්ගලික ආයතන සමඟ සහයෝගීත්වයෙන් පර්යේෂණ පැවැත්වීම ;

(ඈ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයේ යම් තෙල්, හානිකර ද්‍රව්‍ය කිසිවකින් හෝ වෙනත් යම් දූෂකයකින් දූෂණය වීම මනාකරවා කළමනාකරණය කිරීමට, සුරක්ෂිත කිරීමට හා ආරක්ෂා කිරීමට පියවර ගැනීම;

(ඉ) යම් තෙල් වර්ග, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍යයක් සඳහා ප්‍රමාණවත් සහ යෝග්‍ය ප්‍රතිග්‍රාහක පහසුකම් සැලසීම ;

(ඊ) ශ්‍රී ලංකා රජය විසින් ස්ථිර කිරීම, පිළිගැනීම, එකඟවීම, හෝ අනුමත කිරීම සිදුකර ඇති හෝ සිදු කරනු ලැබිය හැකි සමුද්‍ර දූෂණය සම්බන්ධ සියලු ජාත්‍යන්තර සම්මුතීන් සහ අදාළ ප්‍රොටෝකෝල පිළිගැනීම නිර්දේශ කිරීම ;

(උ) ජාතික තෙල් දූෂණ හදිසි සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම ;



(ඌ) ඛනිජතෙල් හෝ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමේ හෝ එහි යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන්, සේවා උපකොන්ත්‍රාත්කරුවන් සහ වෙනත් තැනැත්තන්ගේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම, විධිමත් කිරීම සහ පරීක්ෂා කිරීම ;

(එ) සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ විවිධ ප්‍රජා කණ්ඩායම් අතර දැනුවත් බව ඇති කිරීම ;

(ඒ) ඉහතින් වූ කාර්යයන් සියල්ල හෝ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ වෙනත් යම් සියලු ක්‍රියා හා දේ සිදු කිරීම.

**අධිකාරියේ බලතල**

7. අධිකාරියට පහත සඳහන් බලතලවලින් සියල්ල හෝ යම් බලයක් භාවිතා කළ හැකි ය:—

(අ) නැව් ආශ්‍රිත යම් කටයුත්තකින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන යම් දූෂණයකින් ශ්‍රී ලංකා ජල තීරය හෝ වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය ඵලදායී ලෙස සුරක්ෂිත කිරීම සහ ආරක්ෂා කිරීම ;

(ආ) යම් නැව් ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන යම් දූෂණයක් සම්බන්ධයෙන් පරීක්ෂණ සහ විමසීම් පැවැත්වීම සහ නඩු පැවරීම ;

(ඇ) දූෂණය වැළැක්වීමේ කාර්ය සඳහා, ශ්‍රී ලංකා ජල තීරය තුළ සහ වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ පවත්වාගෙන යන මුහුදු තෙල් ප්‍රවාහන කටයුතු හා බංකරින් මෙහෙයුම් සියල්ල පාලනය කිරීම ;

(ඈ) යම් වරාවල හෝ නිශ්වල දේපළක් අත්කරගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඉ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ දී අවශ්‍ය විය හැකි යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කරවීම ;

(ඊ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන සියලුම ශිල්පක්‍රමවලට කෙලින් ම හෝ තත්කාර්යය සඳහා අධිකාරිය විසින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් එළඹීම සහ ඉටු කිරීම ;

(උ) මේ පනත යටතේ අධිකාරියට පවරන ලද බලතල සියල්ල හෝ ඉන් කිසිවක් පැවරීම සඳහා නාමයෙන් හෝ තනතුරින් යම් තැනැත්තකු පත් කිරීම ;

(ඌ) මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් පැකේජයක් හෝ මූල්‍යායතනයක ගිණුම් විවෘත කර ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම ;

(එ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණය ණයට ගැනීම ;

(ඒ) වංචල හා නිශ්චල දේපළ යන දෙයාකාරයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන ප්‍රදාන, පරිත්‍යාග සහ විත්තවරණ පිළිගැනීම හා ලබා ගැනීම සහ අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා ඒවා යොදා ගැනීම ;

(ඔ) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඕ) අධිකාරිය මගින් සපයනු ලබන යම් සේවාවක් සඳහා යම් තැනැත්තකුගෙන් හෝ පුද්ගල මණ්ඩලයකින් ගාස්තු අය කිරීම ;

(ක) ශ්‍රී ලංකා වරායවලට පැමිණෙන සියලු නැව්වලින් අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු හෝ අයකිරීම් අයකර ගැනීම ; සහ

(ග) අධිකාරියේ කර්තව්‍ය නියමාකාරයෙන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ මේ පනතේ නිශ්චිත ලෙස සඳහන් බලතල කිසිවකට ආනුෂංගික වන්නා වූ හෝ අන්‍යාකාරයකින් අධිකාරිය මත පවරන ලද්දා වූ හෝ භාර කරන ලද්දා වූ වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

බලතල පැවරීම.

8 මේ පනතින් අධිකාරිය වෙත වෙන් කර දෙන ලද හෝ පවරන ලද යම් බලතල හෝ කර්තව්‍යයක් අධිකාරියේ යම් සාමාජිකයකුට හෝ අධිකාරියේ වෙනත් යම් නම් කළ නිලධරයකුට හෝ මේ පනත යටතේ නිශ්චිතව සඳහන් කළ කාර්යයන් සඳහා පත් කළ වෙනත් යම් තැනැත්තකු වෙත පැවරීම නීත්‍යානුකූල විය යුතු ය.



පරීක්ෂා කිරීම සහ සමීක්ෂණය කිරීම සඳහා බලතල

9. (1) යම් ගුවන්යානයකට හෝ තෙල් ඉදිකිරීම් ඇතුළත් වූ යම් පරිශ්‍රයකට යම් දිනක සාධාරණ වේලාවක දී අධිකාරිය විසින් හෝ තත්කාර්ය සඳහා අධිකාරිය විසින් සාමාන්‍ය හෝ විශේෂයෙන් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් ඇතුළුවීම සහ ඉන්පසු අධිකාරියේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ අධිකාරියේ යම් කර්තව්‍යයක් කිරීමට හෝ යම් කාර්යයක් ඉටු කිරීමට සම්බන්ධිත වූ හෝ ආනුෂංගික වූ යම් සමීක්ෂණයක්, පරීක්ෂණයක් හෝ විමර්ශනයක් හෝ කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් තත්කාර්ය සඳහා ලිඛිතව සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ජලතීරය තුළ සහ වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ තිබෙන යම් නැවකට වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද ආකාරයට යම් සාධාරණ වේලාවක ඇතුළු වී යම් උපකරණයක් හෝ නළ මාර්ගයක පරීක්ෂණය හා සම්බන්ධයෙන් වන යම් අක් වෙරළ සවි කිරීමක් විමසා බලා අධිකාරියේ යම් බලතල ක්‍රියාත්මක කිරීමකට, හෝ යම් කාර්යයක් ඉටු කිරීමකට හෝ යම් කර්තව්‍යයක් කිරීමකට සම්බන්ධව හෝ එයට ආනුෂංගිකව යම් සමීක්ෂණයක්, පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පැවැත්වීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් ලිඛිතව බලය දෙන ලද අධිකාරියේ යම් නිලධරයකු විසින් යම් සවි කරන ලද හෝ ජංගම වේදිකාවකට හෝ වෙනත් යම් අදාළ සවි කිරීමකට ගොඩවීම හෝ නිර්දේශ කර ඇති ආකාරයට එකී ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා යම් පරිශ්‍රයකට ඇතුළුවීම නීත්‍යානුකූල විය යුතු ය.

(4) තත්කාලීනව එම අක්වෙරළ සවි කිරීම් උපකරණ, නළ මාර්ගය භාර නිලධරයන් විසින් යම් සමීක්ෂණ, පරීක්ෂණ හෝ විමර්ශන කර ගෙන යාමට අවශ්‍යාවේක්ෂිත පරිදි අධිකාරියට හෝ අධිකාරිය විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට සෑම සහායක් ම දිය යුතු ය.

(5) අධිකාරිය විසින් තත්කාර්යය සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් —

(අ) ශ්‍රී ලංකා ජල තීරය තුළ හෝ වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ හෝ ඒ ජල තීරයට හෝ සමුද්‍ර කලාපයට ඇතුළුවීමට ආසන්න යම් නැවක අයිතිකරුට, ක්‍රියාකරුට හෝ නෞකාධිපතිවරයාට හෝ අනුයෝජිතයාට—

(i) නැවේ සහ එහි යන්ත්‍ර සහ උපකරණවල තත්ත්වය ;

(ii) එහි නැව් බඳුවල ස්වභාවය සහ තත්ත්වය ;

(iii) නැවේ නැව් බඳුවල සහ නැවෙහි බහාලූ ඉන්ධනවල ස්වභාවය සහ ඒ නැව් බඳු හා නැවෙහි ඉන්ධන ගබඩා කර ඇති ආකාරය සහ ගබඩා කර ඇති ස්ථාන ; සහ

(iv) නැවට හෝ නැවේ ඇති නැව් බඳුවලට අදාළව මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කරුණු පිළිබඳව.

තොරතුරු සැපයීමට නියම කිරීම ;

(ආ) ශ්‍රී ලංකා ජල තීරය තුළ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපයක් හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ තිබෙන යම් නැවකට, වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා විමසා ඇතුළු විය හැකි අතර ඒ නැවේ අයිතිකරු, ක්‍රියාකරු, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා, පනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවලින් දක්වා ඇති නියමයන්ට අනුකූල වී ඇත් ද යන්න ඔහුට තහවුරු කර ගැනීමට අවශ්‍ය විය හැකි යම් සෝදිසි කිරීම් සහ පරීක්ෂාවන් පැවැත්වීම ;

(ඇ) නැවක අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපති හෝ අනුයෝජිතයා විසින් නැවක් සම්බන්ධයෙන් තබා ගැනීමට නියම කරන ලද යම් වාර්තා පරීක්ෂා කිරීම සහ එවැනි යම් වාර්තාවක යම් සටහනක් පිටපත් කරවීම සහ ඒ වාර්තා භාර තැනැත්තා විසින් ඒ පිටපත මේ ඡේදය යටතේ සාදන ලද මුල් සටහනේ සත්‍ය පිටපතක් ලෙස සහතික කිරීමට නියම කිරීම ;

(ඈ) අක්වෙරළේ යම් සවි කිරීමක්, උපකරණයක්, නළ මාර්ගයක් හෝ ගොඩබිම් ස්ථානයක් වෙත පැමිණ එම අක්වෙරළේ යම් සවි කිරීම, උපකරණය, නළමාර්ගය හෝ ගොඩබිම් ස්ථානය භාරකරු හෝ ස්ථානභාර තැනැත්තා විසින්, මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවලින් කර ඇති නියමයන්ට අනුකූලව කටයුතු කරන්නේදැයි නිශ්චය කර ගැනීමට අවශ්‍ය වන සිරික්සීම් හා පරීක්ෂණ පැවැත්වීම; හෝ

(ඉ) (i) මේ පනතේ යම් විධිවිධානයකට හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයකට එකඟව ක්‍රියා කිරීම ඒ නැව පැහැරහැර ඇති බව හෝ උල්ලංඝනය කර ඇති බවට සාධාරණ හේතු මත ඔහු සැක කරන්නේ නම්; හෝ





(ii) අයහපත් කාලගුණය, දුර්වල දෘශ්‍යතාව හෝ මුහුදේ ස්වභාවය, නැවේ හෝ එහි යම් උපකරණවල තත්ත්වය හෝ එහි නැවියන් සංඛ්‍යාවෙහි අඩුවක් හෝ එහි නැව් බඳුවල ස්වභාවය සහ තත්ත්වය හේතුකොට එවැනි නියෝගයක් සාධාරණ වන බව සහ යම් තෙල්, හිංසාකාරී ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍ය ශ්‍රී ලංකා ජලතීරය තුළට හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයකට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට මුදාහැරීම, පිට කිරීම හෝ හෙළීම වැළැක්වෙන බවට සැහීමකට පත් වන්නේ නම්,

යම් නැවකට ඔහු විසින් නියම කරනු ලැබිය හැකි යම් මාර්ගයකින් සහ යම් ආකාරයකින් ශ්‍රී ලංකා ජල තීරය තුළින් සහ වෙනත් සමුද්‍ර කලාප තුළින් පිටව යන ලෙසට ද එකී ජල තීරයෙන් පිටත රැඳී සිටීමට ද ඔහු විසින් හඳුන්වාගත් ස්ථානයකට පිටත්ව යාමට, නිශ්චිතව සඳහන් කරන ලද කාලයක් තුළ යාත්‍රාව බැඳ තැබීමට හෝ නැංගුරම් ලෑමට හෝ රඳවා තැබීමට ද නැවක අයිතිකරුට, ක්‍රියා කරවන්නාට, නෞකාධිපතිවරයාට හෝ අනුයෝජිතයාට නියෝග කිරීම

කරනු ලැබිය හැකිය.

(6) මේ වගන්තියෙන් පිරිනමන ලද යම් බලතල ක්‍රියාත්මක කරන යම් තැනැත්තකු විසින් නැව අසාධාරණ ලෙස රඳවා ගැනීම හෝ යම් මුහුදු ගමනක් යෙදීම ප්‍රමාද කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(7) නැවකට සවිකර තිබිය යුතු යයි මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලින් නියම කරන ලද උපකරණ සහ යන්ත්‍ර පිළිබඳ යම් පරීක්ෂණ පැවැත්වීම සඳහා අය කරනු ලබන යම් ගාස්තු අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(8) (අ) ශ්‍රී ලංකා ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවලට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට සැලකිය යුතු ප්‍රමාණයකින් තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය පිට කිරීමක් පවතින බවට හෝ මුදා හැර ඇති බවට හෝ ඉවත ලා ඇති බවට ; හෝ

(ආ) ශ්‍රී ලංකා ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍ර කලාපයට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය සැලකිය යුතු ප්‍රමාණයක පිට කිරීමක්, මුදාහැරීමක් හෝ ඉවතලෑමක් සම්බන්ධයෙන් අනතුරු අත්‍යාසන්න බරපතල අන්තරායක් පවත්නා බවට ; හෝ

විශ්වාස කිරීමට අධිකාරියට හේතු ඇති විට හෝ එයට දැනුම් දී ඇති විටක අධිකාරිය විසින්—

(i) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රදේශය ඇතුළත වූ යම් නැවකට එය පිහිටි ස්ථානය පිළිබඳ අධිකාරියට වහාම වාර්තා කරන ලෙසට නැවේ අයිතිකරුට, ක්‍රියා කරවන්නාට, නෞකාධිපතිවරයාට හෝ අනුයෝජිතවරයාට නියම කිරීම ;

(ii) තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පාලනය කිරීමට හෝ පැතිරයාම වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් හෝ ඒ තෙල් හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍යය ඉවත් කිරීමට සහභාගිවන මෙන් හෝ යම් නැවකට නියම කිරීම හෝ යම් උපකරණයක, නල මාර්ගයක, අක් වෙරළේ සවිකිරීමක් හෝ ගොඩබිම ස්ථානයක අයිතිකරුට, ක්‍රියාකරවන්නාට හෝ භාරව සිටින තැනැත්තාට නැවේ අයිතිකරුට, ක්‍රියා කරවන්නාට, නෞකාධිපතිවරයාට හෝ අනුයෝජිතවරයාට,

නියම කරනු ලැබිය හැකි ය.

නියම කළ පියවර ගැනීමට නියම කිරීමේ බලය.

**10.** (1) යම් ඇති විය හැකි දූෂණයක් වැළැක්වීමට, අඩු කිරීමට, පාලනය කිරීමට සහ ඉවත් කිරීමට නියම කරනු ලැබිය හැකි යම් පියවර ගැනීම සඳහා අධිකාරිය විසින් ඉහත කී කටයුතුවලට සම්බන්ධ නැවේ අයිතිකරුට, ක්‍රියාකරුට, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා හෝ උපකරණයක අයිතිකරුට හෝ ඒ භාරව සිටින තැනැත්තාට හෝ අක්වෙරළේ සවි කිරීම්වල අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නල මාර්ගයේ අයිතිකරුට හෝ ක්‍රියාකරුට හෝ මුහුදේ හෝ ගොඩබිමේ යම් ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහකට නොඅඩු සහ රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත්විය යුතු ය.

යම් නැවක් රඳවා ගැනීමේ බලතල.

**11.** මේ පනත යටතේ පවරනු ලැබිය හැකි නඩු කටයුතු කවරක් වුව ද ශ්‍රී ලංකා ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවලට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් නැවකින් මුදාහැර ඇති බවට විශ්වාස කිරීමට තමන්ට සාධාරණ හේතු ඇත්නම් යම් බලයලත් නිලධරයකු විසින් ඒ නැව රඳවා ගනු ලැබිය හැකි ය. තව ද අධිකාරියේ මතය අනුව මේ පනත යටතේ අයිතිකරුගේ, ක්‍රියාකරුගේ, නෞකාධිපතිවරයාගේ හෝ අනුයෝජිතයාගේ වගකීමට ප්‍රමාණවත් විය හැකි යම් මුදලක් හෝ ඉදිරිපත් කරන යම් ඇපයක් නැවේ අයිතිකරු, ක්‍රියාකරු, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා විසින් තැන්පත් කරන තෙක් නැව එසේ තවදුරටත් රඳවා ගනු ලැබිය හැකි ය.



අත්අඩංගුවට ගැනීමේ බලතල.

**12.** (1) යම් බලයලත් නිලධරයකු විසින් මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වරදක් සිදු කරන යම් තැනැත්තකු අනන්‍ය ආර්ථික කලාප ප්‍රදේශයක දී හැර වෙනත් ප්‍රදේශයක දී බලපත්‍රයක් නොමැතිව වුව ද අත්අඩංගුවට ගනු ලැබිය හැකි අතර, ඔහු අවස්ථාවෝචිත පරිදි අධිකරණ බලය පවතින මහාධිකරණයක විනිශ්චයකාරවරයකු ඉදිරිපිට හෝ අද්මිරාල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණයක් ඉදිරිපිට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් වරදක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ වරද සිදු කරනු ලැබීමේ දී භාවිත කරනු ලැබ ඇති යම් ද්‍රව්‍යයක් අවස්ථාවෝචිත පරිදි අධිකරණ බලය ඇත්තා වූ මහාධිකරණයක් මඟින් හෝ අද්මිරාල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණයක් මඟින් තීරණය කරනු ලැබිය හැකි පරිදි තහනමට ගැනීම හෝ යම් ස්ථානයක රඳවා තැබීම කළ හැකි ය.

බලයලත් නිලධරයකු සාම නිලධරයකු ලෙස සැලකිය යුතු බව.

**13.** (1) සෑම පොලිස් නිලධරයකු ම, හෝ ඒ කාර්යය සඳහා ලිඛිතව නම් කරන ලද පහත සඳහන් නිලධරයන් 12 වන වගන්තියේ කාර්යය සඳහා බලයලත් නිලධරයකු විය යුතු ය :—

(අ) සන්නද්ධ හමුදාවේ නිලධරයකු ;

(ආ) නාවික කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ වෙළෙඳ නැව් අංශයේ නාවික සැලසුම්කරුවකු ;

(ඇ) දූෂණය වැළැක්වීමට, අඩු කිරීමට, පාලනය කිරීමට විශේෂ දැනුමක් ඇති වරාය අධිකාරියේ නිලධරයකු.

(2) සෑම බලයලත් නිලධරයකු ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සාම නිලධරයකු ලෙස සැලකිය යුතු ය.

## III වන කොටස

## සමුද්‍රීය පරිසර සභාවක් පිහිටුවීම

සමුද්‍රීය පරිසර සභාව පිහිටුවීම සහ එහි කර්තව්‍ය.

**14.** (1) (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සමුද්‍රීය පරිසර සභාව නමින් හඳුන්වන සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් එය සමන්විත විය යුතු ය:—

(අ) ධීවර සම්පාදන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ආ) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඇ) සංචාරක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඈ) විදේශ කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඉ) වරාය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඊ) නාවික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(උ) ඛනිජ තෙල් සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඌ) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(එ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පිහිටුවනු ලද මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඒ) 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් සංස්ථා පනතින් පිහිටුවන ලද ලංකා ඛනිජතෙල් සංස්ථාවේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඔ) ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඕ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ක) ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ග) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවනු ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පරිසර ආරක්ෂක ක්ෂේත්‍රය හෝ සමුද්‍රීය දූෂණ ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ දැනුමක් ඇති සාමාජිකයන් දෙදෙනකු ;



(ච) ලංකා නැව් අනුයෝජිතයන්ගේ සංගමයේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන, ඒ සංගමයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු ;

(ජ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පරිසරය ආරක්ෂා කිරීමේ කටයුතුවල නියැලෙන ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධානවල සාමාජිකයන් දෙදෙනකු.

(2) අමාත්‍යවරයා විසින් සභාවේ සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයකු සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(3) සභාවේ කර්තව්‍යයන් විය යුත්තේ—

(අ) අධිකාරියට එහි බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම පිළිබඳ අදාළ කාරණා සම්බන්ධයෙන් උපදෙස් දීම ; සහ

(ආ) අධිකාරිය විසින් සභාව වෙත යොමු කරනු ලැබූ යම් කාරණා පිළිබඳ අධිකාරියට උපදෙස් දීම ය.

15 (1) යම් තැනැත්තෙක්— සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීම පිළිබඳ නුසුදුසුකම්.

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම් නැතහොත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වුවහොත් හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු නම් හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු වුවහොත් හෝ වෙනත් යම් පළාත් පාලන ආයතනයක සභිකයකු නම් හෝ සභිකයකු වුවහොත් ;

(ආ) ශ්‍රී ලාංකික පුරවැසියෙක් නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වුවහොත් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මක වන නීතියක් යටතේ වස්තුභංගත්වයට හෝ බංකොලොත් භාවයට පත් තැනැත්තකු ලෙස ප්‍රකාශිතව, නිදහස් කරනු නොලැබූ වස්තුභංගත්වයට පත් හෝ බංකොලොත් තැනැත්තකු නම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් හෝ තීරණය කරනු ලැබ ඇත්නම් ; හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටියේ නම් හෝ යටත්ව සිටී නම්,

ඒ තැනැත්තා සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ එහි සාමාජිකයකු ලෙස නොකඩවා ධුරය දැරීමට හෝ නුසුදුසු වන්නේ ය.

(2) 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයකු මේ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සකු විය යුතු ය.

(3) 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් සාමාජිකයකු—

(අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් දක්වා ඇති යම් නුසුදුසුකමකට ඔහු යටත් වුවහොත් ; හෝ

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව, ශාරීරික අශක්තතාවයක් හෝ සිහිවිකල බවක් හේතු කොට ගෙන ඔහුගේ කාර්යය ඉටු කිරීමට ස්ථිරව ම නොහැකි තත්ත්වයකට පත් වුවහොත් ; හෝ

(ඇ) අමාත්‍යවරයාගේ මතය අනුව අධිකාරියට අපකීර්තියක් ඇතිවිය හැකි යම් ක්‍රියාවක් ඔහු විසින් සිදුකර ඇත්නම්,

අමාත්‍යවර්යා විසින් ධුරයෙන් ඉවත් කළ යුතු ය.

(4) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සභාපතිවරයා හෝ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සභාවේ වෙනත් යම් සාමාජිකයකු විසින් හෝ ධුරය හිස් කරනු ලැබුවහොත් නැතහොත් ඉහතින් වූ උපවගන්තියේ විධිවිධාන යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ඒ ධුරය දැරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකි ය.

(5) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සභාපතිවරයා හෝ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සභාවේ වෙනත් යම් සාමාජිකයකු අසනීප තත්ත්වයෙන් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා මාස තුනකට නොවැඩි කාලයක් සඳහා තාවකාලිකව තමාගේ ධුරයේ කටයුතු ඉටු කළ නොහැකි තත්ත්වයකට පත්වුවහොත් අමාත්‍යවරයා විසින් අවස්ථාවෝචිත පරිදි සභාපතිවරයා හෝ සාමාජිකයා ලෙස ඔහුගේ තනතුරේ කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සභාපතිවරයා විසින් හෝ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ තත්කාර්යය සඳහා අමාත්‍යවරයා වෙත යවන ලද ලිපියක් මගින් තම ධුරයෙන් ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්විය හැකි ය.



(7) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සභාපතිවරයා සහ (1) වන උපවගන්තිය යටතේ පත් කළ සභාවේ සියලුම සාමාජිකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හා එසේ නිශ්චය කරනු ලබන අනුප්‍රමාණ අනුව, අධිකාරියේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

(8) සභාවේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු සභාවේ සෑම රැස්වීමක ම මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු සභාවේ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(9) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් එකොළොස් දෙනෙකු විය යුතු ය.

(10) සභාව විසින් එහි රැස්වීම් පිළිබඳව සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් වූ කාර්යය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

## අධිකාරියේ කාර්ය මණ්ඩලය

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

16. (1) නාවික, වරාය, මෙහෙයුම් යන ක්ෂේත්‍රවල හෝ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ කළමනාකරණ පිළිබඳ ක්ෂේත්‍රවල ප්‍රමාණවත් පළපුරුද්දක් සහ සුදුසුකම් තිබෙන අධිකාරිය විසින් පත් කරනු ලැබූ සාමාන්‍යාධිකාරීවරයෙක් සිටිය යුතු ය.

(2) ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳ මණ්ඩලයේ සාමාන්‍ය විධානයට යටත්ව ප්‍රධාන විධායක නිලධරයා ලෙස කටයුතු කරනු ලැබිය යුතු වූ සාමාන්‍යාධිකාරීවරයා විසින් අධිකාරියේ කටයුතු, අධිකාරියේ සංවිධාන කටයුතු සහ බලතල ක්‍රියාත්මක කිරීම හා අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීම සහ අධිකාරියේ නිලධරයන් සහ සේවකයන් පාලනය කිරීම සඳහා වූ පරිපාලනයට වගකිව යුතු ය.

(3) නීතිමය ක්ෂේත්‍රයේ හෝ සමාගම් ලේකම් කටයුතු පිළිබඳව පරිචය පිළිබඳ ප්‍රමාණවත් පළපුරුද්දක් සහ සුදුසුකම් ඇති අධිකාරිය විසින් පත් කරනු ලැබූ ලේකම්වරයෙක් මණ්ඩලයට සිටිය යුතු ය.

(4) ලේකම්වරයා මණ්ඩලයේ සියලු ම රැස්වීම්වලට පැමිණ සිටිය යුතු අතර, මණ්ඩලයේ සියලු ම රැස්වීම් වාර්තාවල සටහන් නිසියාකාරයෙන් පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු ය.

සේවා නියුක්ත කොන්දේසි

17. (1) බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ නිලධරයන් සහ සේවකයන්ට අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් සහ අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, ඒ නිලධරයන් හා සේවකයන් අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) අධිකාරියේ ඉල්ලීම පිට රජයේ සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නියම කරනු ලබන කාලසීමාවන් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්තක් ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(4) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළැඹුණු යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා අධිකාරියට සේවය කරනු ලබන යම් සේවා කාලයක් ගිවිසුමේ බැඳීම් ඉටු කිරීම සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) අධිකාරිය විසින් අධිකාරියේ කර්තව්‍යවලින් යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ කාර්ය සඳහා හෝ බලතලවලින් යම් බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා අධිකාරියේ අභිමතය පරිදි, අවශ්‍ය පරිදි හා අවශ්‍ය විටක තාවක, වරාය මෙහෙයුම් කටයුතු සහ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධ හෝ අධිකාරිය විසින් තීරණය කරනු ලබන වෙනත් කරුණු පිළිබඳ මනා පළපුරුද්දක් හා හැකියාවක් දක්වා ඇති පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක උපදේශකයකුගේ තත්වයේ සේවා අධිකාරිය විසින් තීරණය කරනු ලබන ගාස්තුවකට ලබාගත හැකි ය.



V වන කොටස

## මුදල්

අධිකාරියේ අරමුදල

18. (1) අධිකාරියට පහත සඳහන් මුදල් බැර කරනු ලැබිය යුතු අතර, අධිකාරියේ ම අරමුදලක් පවත්වාගෙන යා යුතු ය :—

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ;

(ආ) ස්වකීය බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී අධිකාරියට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර වූ හෝ ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග, පිරිනැමීම් හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඈ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී 1981 අංක 59 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ අධිකාරියේ බැරට ඇති සියලු මුදල් ;

(ඉ) අධිකාරියට ගාස්තු, දඩමුදල්, අයකිරීම්, අයබදු හෝ දණ්ඩන වශයෙන් ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්.

(2) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය ඉටු කිරීමේ දී හා කාර්ය කිරීමේ දී අධිකාරිය විසින් කරනු ලබන යම් වියදමක් දැරීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණයන් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම්

19. (1) අධිකාරියේ වත්කම් සහ බැරකම්, ආදායම් සහ වියදම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමට අධිකාරිය විසින් කටයුතු යෙදිය යුතු ය.

(2) ලින් වර්ෂය, අධිකාරියේ මුදල් වර්ෂය විය යුතු ය.

ගිණුම් සහ විගණනය

20. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## VI වන කොටස

## ප්‍රතිග්‍රහණ පහසුකම් සහ දූෂණය වැළැක්වීමේ ක්‍රියාමාර්ග

අපද්‍රව්‍ය කළමනාකරණය.

21. අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ක්‍රියා කරන විට අධිකාරිය පහත සඳහන් බලාන්වෙල ක්‍රියාත්මක කළ යුතු ය :—

(අ) ශ්‍රී ලංකාවේ වරායයන් භාවිත කරන හෝ ශ්‍රී ලංකා ජල තීරය හෝ වෙනත් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ තීරය පරික්‍රමණය කරන යම් නැවකට තෙල් අවශේෂයන් හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය පිට කිරීමට හෝ හැන්පත් කිරීමට හැකි වන සේ සමුද්‍රීය පාරිසරික සංගාව විමසා ශ්‍රී ලංකාවේ යම් වරායක් ඇතුළත හෝ ඉන් පිටත ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීමට ;

(ආ) බැහැර කිරීම සඳහා තෙල් අවශේෂයන් සහිත නැව් සඳහා අවශ්‍ය කරනු ලබන සියලු ම වරායවල්, නැව් තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන භාරව සිටින තැනැත්තා හෝ නැව් මගින් භාවිත කරන අනිකුත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිග්‍රහණ පහසුකම් සලසන ලෙස විධාන කිරීම ;

මේ ඡේදයේ කාර්ය සඳහා අධිකාරිය විසින් එවැනි පහසුකම් සැලසීම සඳහා වෙනත් යම් තැනැත්තකුගේ සහාය ලබා ගත හැකි ය. නැතහොත් යම් තැනැත්තකු විසින් එවැනි පහසුකම් සැලසීම සඳහා කටයුතු සලස්වනු ලැබිය හැකි ය;

(ඇ) බැහැර කිරීම සඳහා තෙල් අවශේෂයන් සහිත නැව් භාවිත කරනු ලබන සියලුම වරායවල්, නැව් තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන භාරව සිටින තැනැත්තා හෝ නැව් මගින් භාවිත කරන අනිකුත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම් සඳහා අධිකාරිය විසින් සැකසුම් කෙරෙන එවැනි පහසුකම් ලබා ගන්නා ලෙස විධාන කිරීම ;



(ඈ) අධිකාරියට සියලු වරායවල්, නැව් තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව් තටාකාංගන භාරව සිටින තැනැත්තා හෝ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකම් සඳහා—

(i) අධිකාරිය විසින් අනුමත කරනු ලබන අධිකාරියේ අනුමැතිය සහිතව නිරන්තරයෙන් නවීකරණය කළ යුතු අපද්‍රව්‍ය කළමනාකරණය සැලසුමක් සුදානම් කිරීම සඳහා විධාන කිරීමට ; සහ

(ii) අධිකාරිය විසින් අනුමත කරන ලද වර්ගීකරණ සංගමයක් විසින් සාදන ලද පාරිසරික බලපෑම් තක්සේරුවක් (EIA) නියමිත කාලවකවානුවල දී සිදු කිරීම සඳහා විධාන කිරීමට.

22. (1) ශ්‍රී ලංකා ජලතීරයට හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවලට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට ඇතුළුවන සෑම නැවක් ම, තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍ය පිළිබඳ වාර්තා පොත් ගෙන යනු ලැබිය යුතු ය. තෙල් හා දූෂක ද්‍රව්‍යයන්ට අදාළ වාර්තා පොත්

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් නැවක නෞකාධිපතිවරයා, හෝ නැව් භාරව සිටින තැනැත්තා විසින් නැවෙහි හෝ නැව සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණුවලට අදාළ මෙහෙයුම් කිරීම්, තෙල් පිළිබඳ වාර්තා පොතෙහි වාර්තා කළ යුතු ය:—

(අ) නැව්බඩු වශයෙන් වූ තෙල් නැවකට පැටවීම ;

(ආ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයක දී හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට නැව්බඩු වශයෙන් තෙල් නැවකට මාරු කිරීම හෝ නැවකින් තෙල් ආපසු ඉවත් කර ගැනීම ;

(ඇ) යාත්‍රා කරන අතරතුරේ දී නැව්බඩු වශයෙන් වූ තෙල් අභ්‍යන්තරව මාරු කිරීම ;

(ඈ) නැව්බඩු වශයෙන් වූ තෙල් පිට කිරීම ;

(ඉ) (නැව්බඩු හෝ බන්කර ඉන්ධන ටැංකි) තෙල් ඉන්ධන ටැංකිවල පිරවුම් ද්‍රව්‍ය දැමීම හෝ තෙල් ඉන්ධන ටැංකි පිරිසිදු කිරීම ;

(ඊ) එවැනි ටැංකිවලින් පිරවුම් ද්‍රව්‍ය පිට කිරීම සහ ඒ ටැංකි පිරිසිදු කිරීම ;

(උ) තෙල් අඩංගු යම් මිශ්‍රණයක, ජලයෙන් හෝ වෙනත් ද්‍රව්‍යවලින් තෙල් වෙන් කිරීම ;

(ඌ) වෙනත් යම් තෙල් අවශේෂයක් බැහැර කිරීම ;

(එ) ඉහතින් වූ අනුඡේදයන්හි සඳහන් යම් කාරණාවලට අදාළ මෙහෙයුම්වලින් උද්ගතවන තෙල් හෝ ජලය හෝ වෙනත් යම් ද්‍රව්‍ය බැහැර කිරීම ;

(ඒ) යන්ත්‍රෝපකරණවල ඉඩ අවකාශ අතර රැස්වී ඇති නැව් පතුලේ තිබෙන්නා වූ අපිරිසිදු ජලය බැහැර කිරීම ;

(ඔ) යම් නැවක ආරක්ෂාව ඇති කිරීමේ හෝ යම් නැවකට හෝ නැව් බඩුවලට වන හානි වැළැක්වීමේ හෝ මිනිසා ජීවිත ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා තෙල් හෝ තෙල් අඩංගු මිශ්‍රණයක් නැවෙන් පිට කරනු ලබන යම් අවස්ථාවක් ;

(ඕ) නැවකට සිදු වූ හානියක ප්‍රතිඵලය වශයෙන් හෝ කාන්දුවීමේ හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ නැවෙන් තෙල් හෝ තෙල් අඩංගු මිශ්‍රණයක් කාන්දුවන බව හෝ කාන්දු වී ඇති බව සොයා ගනු ලබන යම් අවස්ථාවක ;

(ක) තෙල් ඉවත් කිරීමේ මෙහෙයුම්වල ප්‍රතිඵලයක් වශයෙන් වන සියලු යෝග්‍ය කපාට හෝ කපාටවලට සමාන ස්ථාන වසා දැමීම ;

(ග) නියම කරනු ලබන වෙනත් සියලු මෙහෙයුම්.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තබා ගැනීමට නියමිත යම් වාර්තා නැවේ නෞකාධිපතිවරයා හෝ නැව භාරව සිටින තැනැත්තා විසින් තබා ගත යුතු අතර, ඒ නැව බත්තලක් වන අවස්ථාවක—

(අ) ඒවා බත්තලට තෙල් මාරු කිරීම අදාළ වන තාක් දුරට, තෙල් සපයන තැනැත්තා විසින් ; සහ

(ආ) ඒවා බත්තලවලින් තෙල් මාරු කිරීමට අදාළ වනතාක් දුරට, තෙල් බාර දෙනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින්

තබා ගනු ලැබිය යුතු ය.



(4) අත්වැරැද්දමකින් තෙල් ඉවත් කළ අවස්ථාවල දී එකී අවස්ථා පිළිබඳව සහ ඒ තෙල් ඉවත් කිරීමේ හේතු පිළිබඳව තෙල් වාර්තා පොත්වල වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විස්තර කර ඇති එක් එක් මෙහෙයුම්, ඒ ක්‍රියාවලියට උචිත පොත්වල සියලු සඳහන් කිරීම් සම්පූර්ණ කිරීම සඳහා අදාළ තෙල් වාර්තා පොත්වල ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ම වාර්තා කරනු ලැබිය යුතු ය. එක් එක් සම්පූර්ණ කරන ලද මෙහෙයුම නෞකාධිපතිවරයා හෝ නැව භාරව සිටින තැනැත්තා විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර, තෙල් වාර්තා පොතේ සටහන්, නැවට හිමිකම් ඇත්තේ කවර රටක ධජය ලෙළදීමට ද ඒ රටේ රාජ්‍ය භාෂාවෙන් විය යුතු අතර, තෙල් අපවිත්‍රවීම වැළැක්වීමේ ජාත්‍යන්තර සහතිකයක් දරන නැව් සම්බන්ධයෙන් එය ඉංග්‍රීසි හෝ ප්‍රංශ භාෂාවෙන් තිබිය යුතු ය.

(6) නියම කරනු ලබන දූෂක ද්‍රව්‍ය පිට කිරීමට හෝ පිටවීමට අදාළ වාර්තා නිල ලොග් පොතක් වශයෙන් හෝ වෙනම ලොග් පොතක් වශයෙන් ගෙන යනු ලබන වාර්තා පොතෙහි, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් නෞකාධිපතිවරයා හෝ නැව භාරව සිටින තැනැත්තා විසින් වාර්තා ගත කළ යුතු ය.

(7) මේ වගන්තිය යටතේ තබා ගනු ලැබිය යුතු වාර්තා පොත සහ වෙනත් වාර්තා නියමිත ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(8) යම් නැවක් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වාර්තා පොතක් ගෙනයාම පැහැර හැරිය හොත්, ඒ නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, අනුයෝජිතයා, නෞකාධිපතිවරයා සහ නැව භාරව සිටින තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(9) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් වාර්තා පොතක හෝ මේ වගන්තිය යටතේ තබා ගනු ලබන යම් වාර්තාවක යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් තමාගේ දැනීම අනුව අසත්‍ය වූ හෝ නොමග යවන්නා වූ සටහනක් කරන්නා වූ යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(10) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් වාර්තා පොතක් සියලු සාධාරණ වේලාවල දී අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් නම් කරනු ලබන යම් තැනැත්තකු විසින් පරීක්ෂා කර බැලීම සඳහා පහසුවෙන් ලබා ගත හැකි ස්ථානයක තබනු ලැබිය යුතු ය:

එසේ වුව ද, නියමුවකුගෙන් තොරව ඇද ගෙන යනු ලබන අවස්ථාවක, වාර්තා පොත නැව තුළ තැබිය යුතු අතර, අවසාන සටහන කිරීමේ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

(11) (අ) අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධරයකු විසින්—

(i) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් සමුද්‍ර කලාපයක හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයේ ඇති නැවකට ඇතුළු වී තෙල් වාර්තා පොත හෝ හානිකර ද්‍රව්‍ය හෝ දූෂක ද්‍රව්‍ය සම්බන්ධ වාර්තාගත වෙනත් වාර්තා පොත් පරීක්ෂා කරනු ලැබිය හැකි ය ;

(ii) තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ වාර්තා පොතෙහි කර ඇති සටහන්වල සහතික කළ පිටපතක්, අධිකාරිය වෙත සපයන ලෙස ඒ නැවෙහි නෞකාධිපතිවරයා වෙත හෝ නැව භාරව සිටින තැනැත්තා වෙත ලිඛිත නිවේදනයක් කර ඒ සම්බන්ධයෙන් නිවේදනය ලැබී පැය විසිහතරක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු බවට නියම කරනු ලැබිය හැකි ය ;

(iii) යම් සටහනක පිටපතක් සාදා එය සත්‍ය පිටපතක් ලෙස සහතික කරනු ලැබීමට නෞකාධිපතිවරයාට හෝ නැව භාරව සිටින තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය ;

(ආ) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට එකඟව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ නෞකාධිපතිවරයා හෝ නැව භාරව සිටින තැනැත්තා වරදකට වරදකරු විය යුතු ය.

(12) යම් පරීක්ෂාවක් සිදු කළ යුත්තේ ද මේ වගන්තියේ (11) වන උපවගන්තිය යටතේ සහතික පිටපත් නිකුත් කිරීම සිදු කළ යුත්තේ ද නැව පිටවී යෑම හැකිතාක්දුරට අවම ප්‍රමාදයකින් සිදුවන පරිදි ය.



(13) (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන තුනකට අඩු නොවන සහ රුපියල් මිලියන හයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(14) මේ පනත යටතේ යම් නඩු කටයුතුවල දී—

(අ) මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී, නැවක ගෙන යනු ලබන වාර්තා පොතක් හෝ යම් තබා ගනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන වාර්තා, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය ;

(ආ) යම් වාර්තා පොතක හෝ යම් වාර්තාවක කරන ලද සටහනක පිටපතක් ඒ සටහනේ සත්‍ය පිටපතක් බවට, වාර්තා පොත ගෙන යනු ලබන්නේ යම් නැවක නම්, ඒ නැවේ නෞකාධිපතිවරයා විසින් හෝ නැව භාරව සිටින තැනැත්තා විසින් හෝ ඒ වාර්තාව තබා ගැනීමට යම් තැනැත්තකුට නියම කරනු ලබන්නේ නම්, ඒ තැනැත්තා විසින් හෝ සහතික කරනු ලබන අවස්ථාවක, ඒ පිටපත එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය ;

(ඇ) මේ වගන්තියේ ඉහත විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී පවත්වා ගෙන යන වාර්තා පොතක් හෝ තබා ගනු ලබන වාර්තාවක් යයි කියනු ලබන නැතහොත් මේ උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් පරිදි සහතික කරන ලද පිටපතක් යයි කියනු ලබන යම් ලේඛනයක්, එසේ නොවන බවට ඔප්පු කරනු ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, එවැනි පොතක්, වාර්තාවක් හෝ පිටපතක් යයි පූර්ව නිගමනය කළ යුතු ය.

23 (1) තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍යයක් පිට කිරීම වැළැක්වීම සඳහා නියම කරනු ලබන උපකරණ ශ්‍රී ලංකා ජල තීරයට සහ වෙනත් යම් සමුද්‍ර කලාපයකට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයකට ඇතුළු වන සෑම නැවකටම සවිකර තිබිය යුතු අතර, නියම කරනු ලබන ඒ වැළැක්වීමට අදාළ හෝ ආනුෂංගික නියමයන් ඒ සෑම නැවක් විසින්ම පිළිපැදිය යුතු ය. දූෂණය වැළැක්වීම සඳහා නැව්වල උපකරණ.

(2) මේ වගන්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග කඩ කරනු ලබන නැවක යම් අයිතිකරුවකු, ක්‍රියාකරවන්නකු, නෞකාධිපතිවරයකු හෝ අනුයෝජිතවරයකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන තුනකට අඩු නොවන සහ රුපියල් මිලියන හයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## VII වන කොටස

### සමුද්‍ර විපත්

සමුද්‍ර විපත්

24. (1) යම් සමුද්‍ර විපතකින් හෝ එහි ප්‍රතිඵලය වන යම් ක්‍රියාවකින් ශ්‍රී ලංකා ජල තීරය හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයක හෝ එහි පෙර වෙරළ හෝ ඒ ජල තීරය හෝ පෙර වෙරළ දූෂණය වන හෝ දූෂණය වීමේ ආසන්න තර්ජනයක් ඇති වන අවස්ථාවක, ඒ පෙර වෙරළ හෝ ඒ ජල තීරය සම්බන්ධයෙන් අධිකාරිය විසින්—

(අ) නැවේ අයිතිකරු, නැව කුලියට ගත් තැනැත්තා හෝ නැවේ සන්තකය ඇති වෙනත් යම් තැනැත්තකුට ;

(ආ) නැවේ නෞකාධිපතිවරයාට ;

(ඇ) නැවේ සන්තකය ඇති යම් නැව් බේරාගන්නකුට හෝ නැවේ සන්තකය ඇති සහ බේරා ගැනීමේ කටයුතු භාර යම් නැව් බේරාගන්නකුගේ සේවකයකු හෝ අනුයෝජිතයකු හෝ ද්‍රව්‍ය මුහුදුබත්වීමට හෝ බේරා ගැනීමේ මෙහෙයුම් භාරව සිටින තැනැත්තකු වන යම් තැනැත්තකුට ;

(ඈ) අධිකාරිය විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකුට,

ඒ දූෂණය වීම හෝ ඒ දූෂණය වීමේ තර්ජනය හෝ වැළැක්වීමට, අවම කිරීමට හෝ ඉවත් කිරීමට ඉක්මනින් අවශ්‍ය වන පියවර ඒ නැව හෝ එහි නැව් බඩු හෝ නැව තුළ වූ තෙල් සම්බන්ධයෙන් ගන්නා ලෙස විධාන කරනු ලැබිය හැකි ය.



(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට නිකුත් කරන ලද විධාන මගින්—

(අ) නැව නිශ්චිතව සඳහන් කළ තැනකට ගෙන යා යුතු බවට හෝ නිශ්චිතව සඳහන් කළ ප්‍රදේශයකින් හෝ ස්ථානයකින් ඉවත් කරනු ලැබිය යුතු බවට ;

(ආ) නැව නිශ්චිතව සඳහන් කළ තැනකට හෝ ප්‍රදේශයකට හෝ ස්ථානයකට හෝ නිශ්චිතව සඳහන් කළ මාර්ගයක් ඔස්සේ හෝ නොගෙන යා යුතු බවට ;

(ඇ) අවස්ථාවෝචිත පරිදි යම් තෙල් හෝ වෙනත් නැව් බඩු පැටවීමට හෝ පැටවීම නොකිරීමට නැතහොත් ගොඩබෑමට හෝ පිටකිරීමට ;

(ඈ) නිශ්චිතව සඳහන් කළ බේරා ගැනීමේ ක්‍රියා මාර්ග ගනු ලැබිය යුතු බවට හෝ නොගනු ලැබිය යුතු බවට,

නියම කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ මතය අනුව දූෂණය හෝ දූෂණය පිළිබඳ තර්ජනය අවම කිරීමේ හෝ ඉවත් කිරීමේ කාර්ය සඳහා මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන බලාත්මක නොවන හෝ ප්‍රමාණවත් නොවන බවට ඔප්පු වී ඇත්නම්, අධිකාරිය විසින්—

(අ) නැව හෝ එහි යම් කොටසක් හෝ ගිල්වීම හෝ විනාශ කිරීම සඳහා මෙහෙයුම් භාර ගැනීම;

(ආ) අනවශ්‍යයෙන්ම නැවේ පාලනය අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන මෙහෙයුම් භාර ගැනීම;

(ඇ) නැවේ බඩු පැටවීම හෝ ගොඩබෑම හෝ තෙල් ඉවත් කිරීම ඇතුළත් වන මෙහෙයුම් භාර ගැනීම,

කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට හෝ අධිකාරිය විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට විරුද්ධව වන්දි ඉල්ලා යම් සිවිල් අධිකරණයක කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

24 වන වගන්තිය යටතේ ගනු ලබන ක්‍රියාමාර්ග සැබෑ හෝ අපේක්ෂිත හානියට සමානුපාතික විය යුතු බව.

**25**. (1) 24 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් දෙන ලද යම් විධානයක් ක්‍රියාත්මක කිරීමේ දී යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකු විසින් ම—

(අ) දූෂණය හෝ දූෂණය වීමේ තර්ජනය වැළැක්වීම හෝ අවම කිරීම හෝ ඉවත් කිරීම පිණිස කරන ලද යම් ක්‍රියාවක් ඒ දූෂණයෙන් සිදු වන සැබෑ හානියට හෝ ඇති විය හැකි හානියට සමානුපාත විය යුතු බවට ;

(ආ) කොඩිය අයත් රාජ්‍යයේ, තෘතීය රාජ්‍යයේ සහ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා කෙරෙහි නිසි සැලකිල්ල දැක්වීමට,

වගබලා ගත යුතු ය

(2) (අ) 24 වන වගන්තිය යටතේ දෙන ලද යම් විධානයක් කඩකරන්නා වූ හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ ;

(ආ) 24 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධාන ප්‍රකාර ක්‍රියා කිරීමට බලය දෙන ලද යම් තැනැත්තකුට හිතාමතාම බාධා කරන්නා වූ සෑම තැනැත්තකුම,

මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන පහළොවකට නොඅඩු වන්නා වූ සහ රුපියල් මිලියන තිස්පහක් නොඉක්මවන්නා වූ දඩයකට යටත් විය යුතු ය.

## VIII වන කොටස

## දූෂණය වැළැක්වීම - අපරාධ වගකීම

තෙල් හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයන් ශ්‍රී ලංකා ජල තීරයට පිට කිරීම හෝ පිටවීම.

**26**. යම් නැවකින් හෝ (ගොඩබිම ස්ථානයකට හෝ ගොඩබිම ස්ථානයකින් හෝ වෙනත් නැවකින් හෝ) නැවකට තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය මාරු කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් උපකරණයකින්, හෝ අක් වෙරළේ ඉදි කිරීමකින් හෝ නල මාර්ගයකින් හෝ ගොඩබිම ස්ථානයකින් හෝ මුහුදු පත්ල හෝ යටිපස කැනීම සඳහා හෝ එහි ස්වභාවික සම්පත් කැනීම සඳහා වූ යම් මෙහෙයුමක ප්‍රතිඵලය වශයෙන් හෝ ශ්‍රී ලංකා ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයකට



හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයන් පිටකරනු ලැබුවහොත් නැතහොත් පිට වූවහොත්, එවිට මේ පනතේ විධිවිධානවලට යටත්ව—

(අ) ඒ පිට කිරීම හෝ පිටවීම නැවකින් නම් ඒ නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා ; හෝ

(ආ) නැවකට හෝ නැවකින් තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ දූෂක ද්‍රව්‍යයක් මාරු කරන අතරතුර දී පිට කිරීම හෝ පිටවීම සිදුවුවහොත්, ඒ නැවේ අයිතිකරු හෝ නෞකාධිපතිවරයා නැතහොත් තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ දූෂක ද්‍රව්‍යයන් මාරු කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් උපකරණයකින් පිට කිරීම හෝ පිටවීම සිදුවන අවස්ථාවක, ඒ උපකරණයේ අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා ; හෝ

(ඇ) පිට කිරීම හෝ පිටවීම අක් වෙරළේ ඉදි කිරීමකින් වන්නේ නම්, නැතහොත් මුහුදු පත්ල හෝ එහි යටිපස කැනීම සඳහා වූ හෝ එහි ස්වභාවික සම්පත් කැනීම සඳහා වූ යම් මෙහෙයුම්වල ප්‍රතිඵලයක් වශයෙන් වන්නේ නම්, ඒ ඉදි කිරීමේ අයිතිකරු හෝ එහි පදිංචිකරු හෝ මෙහෙයුම් කර ගෙන යන තැනැත්තා හෝ මෙහෙයුම් භාරව සිටින තැනැත්තා ; හෝ

(ඈ) පිට කිරීම හෝ පිටවීම නල මාර්ගයකින් වන්නේ නම්, ඒ නල මාර්ගයේ අයිතිකරු හෝ ක්‍රියාකරවන්නා ; හෝ

(ඉ) පිට කිරීම හෝ පිටවීම ගොඩබිම ස්ථානයකින් වන්නේ නම් ඒ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ පිට කිරීම හෝ පිටවීම අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ අවසරය නොමැතිව එම ස්ථානයෙහි සිටින වෙනත් තැනැත්තකුගේ ක්‍රියාවකින් සිදු කරනු ලබන්නේ නම්, ඒ තැනැත්තා ; හෝ

මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන හතරකට නොඅඩු වන්නා වූ සහ රුපියල් මිලියන පහළොවක් නොඉක්මවන්නා වූ දඩයකට යටත් විය යුතු ය.

අවසර පත්‍රයක බලය යටතේ පමණක් තෙල් ආදිය ඉවත දැමීම.

**27.** අධිකාරියෙන් ලබාගත් අවසර පත්‍රයක නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව මිස, ශ්‍රී ලංකා ජලතීරයට හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයකට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයන් ඉවත දමන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන හතරකට නොඅඩු වන්නාවූ සහ රුපියල් මිලියන පහළොවක් නොඉක්මවන්නාවූ දඩයකට යටත් විය යුතු ය.

අධිකාරිය වෙත අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම.

**28.** (1) නියම කරනු ලැබිය හැකි ආකෘති පත්‍රයක තත්කාර්ය සඳහා අධිකාරිය වෙත ලිඛිතව නැවක අයිතිකරුවකු හෝ ක්‍රියාකරුවකු නැතහොත් අක්වෙරළ සවිකිරීමක ක්‍රියාකරුවකු හෝ නල මාර්ගයක අයිතිකරුවකු හෝ එම අයිතිකරු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු කරනු ලබන ඉල්ලීමක් මත ශ්‍රී ලංකා ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයකට තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය ඉවතලීම සඳහා එම අයිතිකරු, ක්‍රියාකරු හෝ වෙනත් යම් තැනැත්තකු වෙත බලය පවරමින් අවසර පත්‍රයක් ලබා ගත හැකි ය.

(2) අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි ගාස්තුවක් ගෙවීම මත හැර යම් වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු වෙත අධිකාරිය විසින් හෝ තත්කාර්ය සඳහා අධිකාරිය විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් කිසිදු අවසර පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්—

(i) ලිඛිතව ලබාදිය යුතු අතර, ඒ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලසීමාව සඳහා බලාත්මක විය යුතු ය ;

(ii) නිකුත් කරනු ලබන්නේ යම් නියම හා කොන්දේසිවලට යටත්ව ද එම නියම සහ කොන්දේසි එහි සඳහන් විය යුතු ය ;

(iii) පවරනු නොලැබිය යුතු ය.

අවසර පත්‍රය නිකුත් කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට බලය.

**29.** (1) 28 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබීමේ දී ශ්‍රී ලංකා ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයකට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට ඉවත දමනු ලබන තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයන් ස්වභාවය සහ බැහැර කිරීමේ ස්ථානය සැලකිල්ලට ගෙන අධිකාරිය විසින් අවශ්‍ය



වූ අවසර පත්‍රය ලබාදිය හැකි ය. නැතහොත් ඒ අවසර පත්‍රය ලබාදීමෙන් දේශීය ජල තීරයේ හෝ සමුද්‍ර කලාපවල ජීවත්වන සියලුම ජීවීන් වර්ගවලට හානියක් සිදුවන බවට හෝ ජලයේ ගුණාත්මක භාවයට බලපෑමක් සිදුවන බවට හෝ මුහුදු කාර්යයනට බාධාවක් වන බවට අධිකාරිය සෑහීමට පත් වන්නේ නම් අධිකාරිය විසින් අවස්ථාවෝචිත පරිදි ඒ අවසර පත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකි අතර, ඒ තීරණය වහාම ඉල්ලුම්කරුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) අධිකාරියේ තීරණය මගින් අතෘප්තියට පත් 28 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් එකී තීරණයට එරෙහිව සමුද්‍ර දූෂණය විෂයය භාරව සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් ලේකම්වරයා විසින්—

(අ) එකී අභියාචනය සඳහා අවසර ලබා දී එකී අභියාචනය කරනු ලැබුවේ යම් බලයලත් නිලධරයකුට එරෙහිව ද එම නිලධරයා වෙත අවස්ථාවෝචිත පරිදි එකී බලපත්‍රය නිකුත් කරන ලෙස, අලුත් කරන ලෙස හෝ සංශෝධනය කරන ලෙස හෝ අත්හිටුවීමේ නියෝගයක් හෝ අවලංගු කිරීමේ නියමයක් නිකුත් කරන ලෙස විධාන කරනු ලැබිය හැකි ය ;

(ආ) අභියාචනයට අවසර නොදිය හැකි ය.

(4) අධිකාරිය විසින් (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධානයකට එකඟව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

අවසර පත්‍රයට අදාළ කොන්දේසි.

**30.** ශ්‍රී ලංකා දේශීය ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපයක හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයේ ජීවත්වන ජීවීන් විශේෂයන්ගේ ආරක්ෂාව සහ ජලයේ ගුණාත්මකභාවය, සමුද්‍රීය කාර්යයන් සැලකිල්ලට ගෙන අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි සියලු කොන්දේසි 29 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයකම අන්තර්ගත කර තිබිය යුතු ය. වෙනත් කොන්දේසි අතර, එම කොන්දේසිවලට—

(අ) මුහුදට ඉවත දමනු ලබන තෙල්, යම් දූෂක ද්‍රව්‍ය හෝ හානිකර ද්‍රව්‍යවල පරීක්ෂණයට භාජනය කළ සාම්පල සම්බන්ධයෙන් තත්කාර්ය සඳහා බලයලත් අධිකාරියේ නිලධරයකු විසින් නිකුත් කරනු ලබන වාර්තාවක් නැවේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු බවට නියම කරමින් ; සහ

(ආ) අවසර පත්‍රයේ අධිකාරිය යටතේ භාවිත කරනු ලබන නැව, අවසර පත්‍රයේ නිශ්චිතව දැක්වෙන කාර්ය සඳහා සහ එහි සඳහන් වේලාවන් සහ දිනයන් තුළ දී පමණක් භාවිත කරන බවට නියම කරමින්,

කොන්දේසි ඇතුළත් විය හැකි ය.

බලය දෙන ලද නෞකාව පිළිබඳ අවසර පත්‍රයේ සඳහන් කිරීම

**31**. 29 වන වගන්තිය යටතේ යම් නෞකාවකට, තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍ය දේශීය ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍ර කලාපයකට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට දමනු ලැබීමට අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී අවසර පත්‍රය මගින් පාවිච්චි කිරීම සඳහා අවසර දෙනු ලැබූ නෞකාව ගමන් කරන්නේ යම් ධජයක් යටතේ ද එම ධජය පිළිබඳව සහ අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් විස්තර අධිකාරිය විසින් අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

අවසර පත්‍රය පැවරිය නොහැකි බව

**32**. 29 වන වගන්තියේ නිශ්චිතව සඳහන් යම් තැනැත්තකු වෙත එම වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු නොලැබිය යුතු අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශුන්‍ය සහ බලරහිත විය යුතු ය.

වගකීමෙන් නිදහස් කිරීම.

**33**. (අ) යම් ලිඛිත නීතියකින් පවරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ අමාත්‍යවරයාගේ ලිඛිත උපදෙස් යටතේ කරන ලද යම් කටයුත්තක දී, ගිලුනු, වෙරළේ වැදුනු හෝ අත්හරින ලද යාත්‍රා අධිකාරිය විසින් ඉවත් කිරීමේ ප්‍රතිඵලය වශයෙන් තෙල් හෝ හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිට කරනු ලැබුවේ නම් හෝ ඉවත දමනු ලැබුවේ නම්;

(ආ) දූෂණයෙන් වන හානි හැකි පමණ අඩු කිරීම හෝ ඉවත් කිරීම පිණිස, දූෂණය පිළිබඳ නිශ්චිත සිද්ධීන් මර්දනය කිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය ඇතුළත් හානිකර ද්‍රව්‍ය පිට කරනු ලැබුවේ නම් හෝ දමනු ලැබුවේ නම්,

24 වන වගන්තිය හෝ 26 වන වගන්තිය යටතේ වරදකට කිසිම තැනැත්තකු යටත් කරනු නොලැබිය යුතු ය.



## IX වන කොටස

## දූෂණය වැළැක්වීම - සිවිල් වගකීම

සිවිල් වගකීම

**34**. (1) 24 වන වගන්තියේ හෝ 26 වන වගන්තියේ සඳහන් යම් ක්‍රියාවක ප්‍රතිඵලය වශයෙන් ශ්‍රී ලංකා ජල තීරයේ සහ වෙනත් සමුද්‍රීය කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ හෝ වෙරළ කලාපය දූෂණය වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, දැනට නැවේ අයිතිකරු, ක්‍රියාකරුවන් හෝ උපකරණයේ අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා හෝ අක්වෙරළේ ඉදිකිරීමේ අයිතිකරු හෝ එහි පදිංචිකරු හෝ නල මාර්ගයේ අයිතිකරු හෝ එහි පදිංචිකරු හෝ ගොඩබිම ස්ථානය අයිතිකරු හෝ එහි පදිංචිකරු හෝ ඛනිජතෙල් සම්පත් ඇතුළු ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමේ කාර්යයේ යෙදී සිටින යම් තැනැත්තකු හෝ එම මෙහෙයුම් භාරව සිටින යම් තැනැත්තකු—

(අ) යම් තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය, ශ්‍රී ලංකා දේශීය ජල තීරයට සහ වෙනත් සමුද්‍රීය කලාපයකට හෝ පෙර වෙරළට හෝ ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයට හෝ එය ආශ්‍රිත යම් සම්බන්ධයකට පිට කිරීමෙන්, පිටවීමෙන් හෝ ඉවත දැමීමෙන් සිදුවුනු යම් හානියක් සම්බන්ධයෙන්;

(ආ) යම් තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍ය ශ්‍රී ලංකා දේශීය ජල තීරයට සහ වෙනත් සමුද්‍රීය කලාපයකට හෝ පෙර වෙරළට හෝ ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයට හෝ එය ආශ්‍රිත යම් සම්බන්ධයකට පිට කිරීමෙන්, පිටවීමට සැලැස්වීමෙන් හෝ ඉවත දැමීමෙන් සිදු වුනු යම් හානියක් වැළැක්වීමේ, අඩු කිරීමේ හෝ ඉවත් කිරීමේ කාර්යය සඳහා ගන්නා ලද යම් ක්‍රියාමාර්ගවල වියදම් සම්බන්ධයෙන්,

වගකීමට යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා, ශ්‍රී ලංකා දේශීය ජල තීරය හෝ වෙනත් යම් සමුද්‍ර කලාප හෝ පෙර වෙරළ ආශ්‍රිත සම්බන්ධය යන්න—

(අ) ධීවර කටයුතු ඇතුළුව සමුද්‍රික, වෙරළබඩ, වරාය හෝ මෝදර කටයුතු ;

(ආ) සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ වෙරළ සහ කොරල් ගල්පර ඇතුළුව ශ්‍රී ලංකා දේශීය ජල තීරයේ හෝ සමුද්‍රීය කලාපයේ හෝ සෙසු වෙරළේ සංචාරකයන්ගේ සිත් ගන්නා තැන් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම;

(ඇ) වෙරළබඩ ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය සහ යහපත;

(ඈ) සජීවී මුහුදු සම්පත් සහ වන සතුන් ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම,

ඇතුළත් වේ.

(3) නැව් දෙකකින් හෝ වැඩි ගණනකින් යම් තෙල්, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිට කරනු ලැබ හෝ පිට වී හෝ ඉවත දමනු ලැබ, එක් එක් නැවේ අයිතිකරු හෝ ක්‍රියාකරවන්නා මේ වගන්තිය යටතේ වගකීමට යටත් වන්නා වූ ද එක් එක් අයිතිකරු හෝ ක්‍රියාකරවන්නා වගකිවයුතු හානිය හෝ වියදම් අනෙක් තැනැත්තා හෝ තැනැත්තන් වගකිවයුතු හානියක් හෝ වියදම් වලින් සාධාරණ ලෙස වෙන් කරනු ලැබිය නොහැකි වන්නා වූ ද අවස්ථාවක, මේ වගන්තිය යටතේ අයිතිකරු හෝ ක්‍රියාකරවන්නා වගකීමට යටත් වන සම්පූර්ණ හානිය හෝ වියදම සම්බන්ධයෙන් එක් එක් අයිතිකරු හෝ ක්‍රියාකරවන්නා හෝ වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් සමග එක්ව හා වෙන් වෙන්ව යටත් විය යුතු ය.

වගකීම සීමාකිරීම.

**35.** (1) (අ) මේ පනත යටතේ සාදනු ලබන නියෝගවලට ඇතුළත් කරනු ලැබිය හැකි 1992 තෙල් දූෂණ සහ අලාභ සම්බන්ධයෙන් වූ සිවිල් වගකීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ විධිවිධානවලට අනුකූලව 34 වන වගන්තිය යටතේ යම් එක් සිද්ධියක් සම්බන්ධයෙන් වගකීම සීමා විය යුතු ය;

(ආ) මේ පනතේ මේ කොටස යටතේ, අවස්ථාවෝචිත පරිදි නැවක අයිතිකරු හෝ ක්‍රියාකරවන්නා විසින් හෝ උපකරණයක අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා විසින් හෝ අක්වෙරළේ ඉදිකිරීමක, නල මාර්ගයක හෝ ගොඩබිම ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් හෝ ඛනිජතෙල් සම්පත් ඇතුළු ස්වාභාවික සම්පත් කැනීමේ මෙහෙයුම්වල කටයුතු කරන යම් තැනැත්තකු හෝ එම මෙහෙයුම් කටයුතු භාරව සිටින යම් තැනැත්තකු විසින් හෝ දරනු ලබන උපරිම වගකීම මෙම පනත යටතේ සාදනු ලබන නියෝග වලට ඇතුළත් කරනු ලැබිය හැකි 1992 තෙල් දූෂණ සහ අලාභ සම්බන්ධයෙන් වූ සිවිල් වගකීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ විධිවිධානවලට අනුකූලව සීමා විය යුතු ය.



(2) 34 වන වගන්තියෙහි සඳහන් යම් ක්‍රියාවක් අවස්ථාවෝචිත පරිදි, නැවක අයිතිකරුගේ හෝ ක්‍රියාකරවන්නාගේ හෝ උපකරණයක අයිතිකරුගේ හෝ එය භාරව සිටින තැනැත්තාගේ හෝ අක්වෙරළේ ඉදි කිරීමක, නල මාර්ගයක හෝ ගොඩබිම් ස්ථානයක අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ ඛනිජතෙල් සම්පත් ඇතුළු ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමේ මෙහෙයුම්වල කටයුතු කරන යම් තැනැත්තකුගේ හෝ මෙහෙයුම් කටයුතු භාරව සිටින යම් තැනැත්තකුගේ නොසැලකිල්ල නිසා සිදු වූ අවස්ථාවක, මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති සීමාකිරීම් වලින් ප්‍රයෝජන ගැනීමට ඒ තැනැත්තාට හිමිකම් නැත්තේ ය.

අනිවාර්ය රක්ෂණය.

**36.** (1) තොග වශයෙන් වූ තෙල් මෙට්‍රික් ටොන් දෙදහසකට වැඩි ප්‍රමාණයක් නැව් බඩු වශයෙන් රැගෙන, ශ්‍රී ලංකාවේ වරායකට ඇතුළු වන්නා වූ හෝ ඉන් පිටවන්නා වූ හෝ ශ්‍රී ලංකා දේශීය ජල තීරය සහ වෙනත් සමුද්‍රීය කලාප හෝ ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් සමුද්‍රීය කලාපයක පර්යන්තයකට ඇතුළු වන්නා වූ හෝ ඉන් පිටවන්නා වූ නැවක අයිතිකරු හෝ ක්‍රියාකරවන්නා විසින් ඒ නැව සම්බන්ධයෙන් වලංගු රක්ෂණ සහතිකයක් හෝ බැංකුවක ඇපකරයක් වැනි මූල්‍යමය ඇපයක් හෝ අධිකාරියට පිළිගත හැකි ජාත්‍යන්තර අරමුදලකින් නිකුත් කරන ලද සහතිකයක් හෝ 1992 තෙල් දූෂණ සහ අලාභ සම්බන්ධයෙන් වූ සිවිල් වගකීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට පාර්ශ්වකරුවකු වන්නා වූ රාජ්‍යයක ඒ නැව ලියාපදිංචි කරනු ලැබ ඇත්නම්, ඒ රාජ්‍යයේ උචිත බලධරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් වැනි වෙනත් මූල්‍ය ඇපකරයක් හෝ තබාගත යුතු ය.

(2) නැවක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ නියමිත රක්ෂණ සහතිකයක් හෝ වෙනත් ඇපකරයක් නැවෙහි ගෙන යනු ලැබිය යුතු අතර, ඉල්ලූ විට නෞකාධිපතිවරයා විසින් අධිකාරිය වෙත හෝ අධිකාරිය විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු වෙත හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය කඩ කරමින් නැවක් ශ්‍රී ලංකාවේ වරායකට ඇතුළු වන හෝ ඉන් පිටවන හෝ ශ්‍රී ලංකාවේ වරායකට ඇතුළුවීමට හෝ ඉන් පිටවීමට තැත් කරන හෝ ශ්‍රී ලංකා ජලතීරයට සහ වෙනත් සමුද්‍රීය කලාපයකට හෝ පැමිණෙන හෝ ඉන් පිටවන හෝ ශ්‍රී ලංකා ජල තීරයට පැමිණීම හෝ ඉන් පිටවීමට තැත්කරන අවස්ථාවක, ඒ නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා හෝ නෞකාධිපතිවරයා මේ පනත යටතේ

වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන එකකට නොඅඩුවන්නා වූ සහ රුපියල් මිලියන පහක් නොඉක්මවන්නා වූ දඩයකට යටත් විය යුතු ය.

(4) (2) වන වගන්තියෙන් නියමිත පරිදි සහතිකයක් හෝ රක්ෂණ සහතිකයක් ගෙනයාම නැවක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක හෝ සහතිකයක් හෝ රක්ෂණයක් ඉදිරිපත් කිරීම නැවේ නෞකාධිපතිවරයා විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා හෝ නෞකාධිපතිවරයා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන එකකට නොඅඩුවන්නා වූ සහ රුපියල් මිලියන හයක් නොඉක්මවන්නා වූ දඩයකට යටත් විය යුතු ය.

(5) නැවක් මේ වගන්තිය කඩකරමින් ශ්‍රී ලංකාවේ වරායකින් පිටවීමට තැත් කරන අවස්ථාවක, අධිකාරිය විසින් නැව රඳවා ගනු ලැබිය යුතු ය.

තෙල් මාරු කිරීම පිළිබඳ සීමා.

**37.** (1) වරාය අධිපතිවරයා වෙත සාමාන්‍ය හෝ විශේෂ දැන්වීමක් කරනු ලැබ ඇත්නම් සහ ගිනි නිවන සමුදායෙන් පූර්ව අනුමතිය ලබා ගෙන ඇත්නම් මිස, එක් දිනයක පස්වරු 6.00 සිට පෙරවරු 6.00 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ යම් වරායක නැවකට හෝ නැවකින් තෙල් මාරු කිරීම යම් නැවක අයිතිකරුවකු, ක්‍රියාකරවන්නකු, නෞකාධිපතිවරයකු හෝ අනුයෝජිතයකු හෝ යම් ස්ථානයක පදිංචිකරුවකු විසින් කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් නැවකට හෝ යම් නැවකින් තෙල් මාරු කරනු ලැබුවහොත්, නැවේ නෞකාධිපතිවරයා හෝ තෙල් මාරු කරනු ලබන ගොඩබිමේ යම් ස්ථානයක පදිංචිව සිටින තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන හතරකට අඩු නොවන සහ රුපියල් මිලියන පහ නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීමේ—

(අ) තෙල් මාරු කිරීම සිදු කරනු ලබන ස්ථානය ; සහ

(ආ) තෙල් මාරු කිරීම ක්‍රියාත්මක කරනු ලබන්නේ කවර වේලාවල් සහ කාලයක් ඇතුළත ද යන වග,

සඳහන් කරනු ලැබිය යුතු ය.



(4) (3) වන උපවගන්තියේ සඳහන් කාලය කිසිම කාරණයක දී අනුමතයේ දින සිට මාස දොළහක කාලයක් නොඉක්මවිය යුතු ය.

දේශීය ජල තීරය ආදියට තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකිරීම වාර්තා කිරීමේ යුතුකම.

**38.** කවර හෝ හේතුවක් නිසා—

(අ) නැවකින් ;

(ආ) තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් මාරු කිරීමට භාවිත කරනු ලබන උපකරණයකින් ;

(ඇ) අක් වෙරළ ඉදිකිරීමකින් ;

(ඈ) නල මාර්ගයකින් ;

(ඉ) ගොඩබිම ස්ථානයකින් ;

(ඊ) ස්ථිර හෝ ජංගම වේදිකාවකින්,

ශ්‍රී ලංකා දේශීය ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයකට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යයක් පිටකරනු ලැබුවහොත්, පිටවුවහොත් හෝ ඉවත දමනු ලැබුවහොත්, එවිට අවස්ථාවෝචිත පරිදි, නැවේ අයිතිකරු හෝ ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා නැතහොත් උපකරණයේ අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා නැතහොත් අක්වෙරළ ඉදිකිරීමේ, නල මාර්ගයේ හෝ ගොඩබිම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඛනිජතෙල් සම්පත් ඇතුළු ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමේ මෙහෙයුම්වල කටයුතු කරන යම් තැනැත්තකු හෝ එම මෙහෙයුම් කටයුතු භාරව සිටින තැනැත්තකු විසින් හෝ ඒ සිද්ධිය පිළිබඳ සියලු විස්තර අධිකාරිය වෙත වහාම වාර්තා කළ යුතු ය. තව ද ඔහු එසේ කිරීම පැහැර හැරියහොත් මේ පනත යටතේ ඔහු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් මිලියනයකට නොඅඩුවන්නා වූ සහ රුපියල් මිලියන පහක් නොඉක්මවන්නා වූ දඩයකට යටත් විය යුතු ය.

තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලැස්ම.

**39.** (1) නැවකට නැතහොත් නැවකින් තෙල් මාරු කිරීම සඳහා භාවිත කරනු ලබන වරායවල්, නැව් තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියාපළවල්, නිර්ජල නැව් තටාකාංගන, අක් වෙරළ ඉදිකිරීම්, නල මාර්ග හෝ වෙනත් උපකරණ භාරව සිටින සියලු තැනැත්තන්

විසින් මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට මාසයක් ඇතුළත, තෙල් උකුරා යාම පිළිබඳ හදිසි සැලැස්මක් ඉදිරිපත් කළ යුතු බවට විධාන කිරීමට අධිකාරියට බලය තිබිය යුතු ය ; තව ද එම සැලැස්මේ යම් කරුණු අඩංගු විය යුතු අතර, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව තෙල් උකුරා යාම පිළිබඳ හදිසි සැලැස්මක් ඉදිරිපත් කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබූ විට රුපියල් හත්ලක්ෂ පනස් දහසකට නොඅඩු සහ රුපියල් පහළොස් ලක්ෂයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

## X වන කොටස

## ඛනිජතෙල් ඇතුළු ස්වභාවික සම්පත් කැනීම්වල හෝ වෙනත් අදාළ කටයුතුවල හෝ නියැලීමේ දී සිදුවන දූෂණ වැළැක්වීම

ඛනිජතෙල් ඇතුළු ස්වභාවික සම්පත් කැනීම්වල නියැලී සිටින තැනැත්තන් විසින් අනුගමනය කළ යුතු ප්‍රමිති.

40. (1) ඛනිජතෙල් ඇතුළු ස්වභාවික සම්පත් කැනීම් හෝ වෙනත් අදාළ කටයුතු හෝ කරගෙන යාමට හැකහොත් එකී කටයුතුවල නියැලීමට අදහස් කරන යම් තැනැත්තකු—

(i) නියමිත ජාතික ප්‍රමිතිවලට අනුකූල විය යුතු අතර දූෂණය පාලනය කිරීම සහ වළක්වන බවට සහතිකවීමේ කාර්ය සඳහා නියමිත දූෂණ මර්දන උපකරණ සවිකර ඒවා නඩත්තු කළ යුතු ය ;

(ii) සමුද්‍රීය ඉවත හෙලීමට අදාළ නියමිත කොන්දේසිවලට අනුකූලව තොගයක් වශයෙන් සියලු කර්මාන්ත අපද්‍රව්‍ය ඔහු විසින් බැහැර කරනු ලැබිය යුතු ය ;

(iii) තෙල් ගබඩා කිරීමේ යන්ත්‍ර සඳහා භාවිත කරනු ලබන උපකරණ සහ තෙල් ප්‍රවාහන නල අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිතිවලට අනුකූල වන බවට සහතික විය යුතු ය ;

(iv) නියමිත ආකාරයට තෙල් විසිරවීමේ හැකියාව ඇති රසායනික ද්‍රව්‍ය භාවිත කිරීම සඳහා ඔහු විසින් අධිකාරියේ පූර්ව ලිඛිත අනුමතිය ලබා ගත යුතු ය ;

(v) ඩයිනමයිට් හෝ ඊට සමාන භාහිකර පුපුරණ ද්‍රව්‍ය භාවිත කිරීමේ කාර්යය සඳහා ඔහු විසින් නියමිත ආකාරයට බලපත්‍රයක් ලබා ගත යුතු ය.



(2) ඛනිජතෙල් ඇතුළු ස්වභාවික සම්පත් කැණීම හෝ අදාළ වෙනත් කටයුතු හෝ කරගෙන යාමට සහ එකී කටයුතුවල නියැලී සිටීමට අදහස් කරන සෑම තැනැත්තෙකුම (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

වැරදි සහ දණ්ඩන.

41. (1) 40 වන වගන්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් මිලියන තුනකට නොඅඩු සහ රුපියල් මිලියන හයකට නොවැඩි දඩයකට යටත්විය යුතු අතර, ඊට අමතරව හැකි අවස්ථාවන්හි දී පරිසරයට සිදුවන අලාභය ඉවත් කිරීම හෝ ඊට ප්‍රතිකර්ම යෙදීම, දූෂණයට භාජන වූ ප්‍රදේශය පිරිසිදු කිරීමේ දී අධිකාරිය විසින් යම් වියදමක් දරනු ලැබුවේ නම් එම වියදම ප්‍රතිපූරණය කිරීම සහ පරිසරයට සිදු වූ අලාභය හේතුකොට ගෙන රජයට සිදු වූ යම් පාඩුවක් සඳහා රජයට වන්දි මුදල් ගෙවීම සිදු කළ යුතු ය.

(2) (i) සමුද්‍රීය හෝ පරිසර දූෂණය සිදු කරන;

(ii) ප්‍රධාන පෙළේ තෙල් දූෂණ අනතුරක් අධිකාරිය වෙත වාර්තා කිරීම පැහැර හරින;

(iii) තෙල් විසිරවීමේ හැකියාව ඇති රසායනික ද්‍රව්‍ය භාවිත කිරීමේ දී නියමිත ප්‍රමිති අනුගමනය කිරීම පැහැර හරින;

(iv) නියමිත ආකාරයට දූෂණ මර්දන වාර්තා පොත පවත්වාගෙන යාම පැහැර හරින;

(v) දූෂණ මර්දන වාර්තා පොතෙහි අසත්‍ය සටහන් ඇතුළත් කරන;

(vi) අධිකාරිය විසින් දෙන ලද යම් විධානයක් ඉටු කිරීම පැහැර හරින,

යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන තුනකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

## XI වන කොටස

## විවිධ විධිවිධාන

රඳවා ගනු ලැබූ නැව බැහැරව යාත්‍රා කිරීම.

42. (1) 11 වන වගන්තිය යටතේ හෝ 36 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ යම් නැවක් රඳවාගනු ලැබුවහොත් සහ නිසි අධිකාරිය විසින් ඒ නැව මුදා හරිනු ලැබීමට පෙර එය මුහුද බලා නැවත

යාත්‍රා කළහොත් ඒ නැව මුහුද බලා නැවත යාත්‍රා කිරීමේ ක්‍රියාවට පාර්ශ්වකරුවකු වූ හෝ සම්බන්ධ වූ නෞකාධිපතිවරයා, අයිතිකරු, ක්‍රියාකරවන්නා, අනුයෝජිතයා හෝ වෙනත් යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන හයකට නොඅඩු වන්නා වූ සහ රුපියල් මිලියන පහළොවක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) යම් නැවක් රඳවා ගැනීමට මේ පනත යටතේ බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් අවශ්‍ය යයි අදහස් කරන්නේ නම් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්ගේ සහාය ලබාගත හැකි ය.

විදේශීය නැව රඳවා ගැනීම පිළිබඳව කොන්සල් නිලධරයාට දැනුම් දිය යුතු බව.

43. (1) (අ) යම් විදේශීය නැවක් මේ පනත යටතේ රඳවා ගනු ලැබූ ; සහ

(ආ) ඒ නැවේ නෞකාධිපතිවරයාට හෝ අයිතිකරුට විරුද්ධව මේ පනත යටතේ යම් නඩු කටයුතු පවරනු ලැබූ,

කවර වූ හෝ අවස්ථාවක ඒ නැව ලියාපදිංචි කරනු ලැබුවේ කුමන ධජයට අයත් රටක් යටතේ ද ඒ රටේ කොන්සල් නිලධරයාට ද අධිකාරිය විසින් නොපමාව ඒ දැන්වීම භාර දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාර දෙනු ලැබිය යුතු දැන්වීමෙහි නැව රඳවා ගනු ලැබූ හෝ නඩු කටයුතු පවරනු ලැබූ හේතු නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

දැන්වීම් ලිඛිතව විය යුතු බව.

44. යම් දැන්වීමක්, අධිකාරයක්, නියමයක්, විධානයක් හෝ වෙනත් නිවේදනයක් අධිකාරිය විසින් (මේ පනත යටතේ පත් කරන ලද නිලධරයකු නොවන) යම් තැනැත්තකුට දීමට හෝ කිරීමට මේ පනතින් හෝ ඒ යටතේ හෝ නියම කරනු ලැබූ හෝ බලය දෙනු ලැබූ අවස්ථාවක, එය ලිඛිතව කරනු ලැබිය යුතු ය. නැතහොත් දෙනු ලැබිය යුතු ය.

ලේඛන භාර දීම.

45. (1) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු වෙත යම් ලේඛනයක් භාර දෙනු ලැබීමට ඇති අවස්ථාවක-

(අ) එය භාර දෙනු ලැබිය යුතු තැනැත්තාට එහි පිටපතක් පෞද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු අවසාන වශයෙන් පදිංචිව ඇතැයි දන්නා ස්ථානයෙහි ඒ පිටපත තැබීමෙන් හෝ ඒ පිටපත තැපැල් මගින් ප්‍රේෂණය කිරීමෙන් හෝ යැවීමෙන් හෝ අනුපිටපතක් යැවීමෙන් ;



(ආ) (i) (නැවක නෞකාධිපතිවරයකු ඇති අවස්ථාවක) නැවේ නෞකාධිපතිවරයා වෙත ; හෝ

(ii) නැවේ කාර්ය මණ්ඩලයට අයත් පුද්ගලයකු වෙත,

ලේඛනය භාර දෙනු ලැබිය යුතු නම් ඔහුට ලැබීම පිණිස ඒ ලේඛනය නැවෙහි අණදීම් හෝ නැව භාරව සිටින හෝ එලෙස පෙනී යන තැනැත්තා වෙත ඒ නැවෙහි තැබීමෙන් ; සහ

(ඇ) ලේඛනය නැවක නෞකාධිපතිවරයා වෙත භාර දෙනු ලැබිය යුතු වූ ද සහ නෞකාධිපතිවරයකු නොමැති වූ ද, නෞකාව ශ්‍රී ලංකාවේ ජලතීරයේ හෝ වෙනත් සමුද්‍රීය කලාපයක හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයේ ඇත්තා වූ ද අවස්ථාවක එම නැවේ කළමනාකරණ අයිතිකරුවකු වෙත හෝ එවැනි කළමනාකරණ අයිතිකරුවකු ශ්‍රී ලංකාවේ ජල තීරයේ හෝ වෙනත් සමුද්‍රීය කලාපයක හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයේ නොමැති විට අයිතිකරුගේ ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින යම් නියෝජිතයකු වෙත හෝ භාරදිය යුතු අතර, එවැනි නියෝජිතයකු නොදන්නා වූ හෝ සොයා ගත නොහැකි විටක, නැවේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එම පිටපත ඇලවීමෙන් හෝ,

ඒ ලේඛනය භාරදෙනු ලැබිය හැකි ය.

(2) මුහුදු ගමන් සඳහා නුසුදුසු හෙයින් නැව රඳවා ගැනීමට අදාළව මේ පනත යටතේ යම් ලේඛනයක් නැවක නෞකාධිපතිවරයා වෙත භාරදීමට අවහිර කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන හතකට නොඅඩු හෝ රුපියල් මිලියන අටක් නොඉක්මවන්නාවූ දඩයක් හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් යම් අවහිර කිරීමකට පාර්ශ්වකරුවකු වන හෝ සම්බන්ධයක් ඇති නැවක යම් අයිතිකරුවකු හෝ නෞකාධිපතිවරයකු වරදක් කරන අතර, ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දෙකකට නොඅඩු වන්නා වූ දඩයකට හෝ රුපියල් මිලියන අටක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

නැව් විකිණීම.

46. නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා මේ පනතේ විධිවිධාන යටතේ වරදකට වරදකරු කරනු ලැබ නියම කරන ලද යම් දඩයක් ගෙවීම හෝ දරන ලද යම් වගකීමක් ඉටු කිරීම හෝ අධිකරණය විසින් ආඥා කරනු ලැබූ කාලය තුළ නොකරනු ලැබූ විට අධිකරණය, ගෙවීම බලාත්මක කිරීම සඳහා වූ යම් බලතලවලට අතිරේකව නොගෙවා ඇති මුදල් ප්‍රමාණය, ඒ නැව, නැව් පත්‍රය, නැව සන්තකයේ වූ දැව භාණ්ඩ සහ ඇඟලුම් පහතම් කොට විකිණීමෙන් ගෙවීමට විධාන කිරීමේ බලය ඒ අධිකරණයට ඇත්තේ ය.

පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

47. පිළිවෙළින් (357 වන අධිකාරය වූ) (358 වන අධිකාරය වූ) (359 වන අධිකාරය වූ) යුධ හමුදා පනත, නාවික හමුදා පනත ගුවන් හමුදා පනත යන පනත්වල විධිවිධාන බලපවත්වන ශ්‍රී ලංකාවේ නාවික හමුදාවට, යුද්ධ හමුදාවට හෝ ගුවන් හමුදාවට අයත් නැව්වලට මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

අධිකරණවල අධිකරණ බලය.

48. (1) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ පටහැනිව කුමක් සඳහන්ව වුව ද ශ්‍රී ලංකා දේශීය ජල තීරයෙහි සහ වෙනත් සමුද්‍රීය කලාපයක දී කරන ලද වරදක් සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඡ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පළාත්බද මහාධිකරණය විසින් හෝ ශ්‍රී ලංකාවේ අධිකරණ කලාපයක පවත්වනු ලබන මහාධිකරණයක හෝ අද්මිරාල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණය විසින් හෝ නඩු විභාග කරනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ VIII වන කොටසේ සඳහන් යම් ක්‍රියාවක් හෝ අත්හැරීමක් සම්බන්ධයෙන් පවරනු ලබන සෑම නඩුවක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඡ ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලැබූ පළාත්බද මහාධිකරණයක් විසින් හෝ ශ්‍රී ලංකාවේ යම් අධිකරණ කලාපයක පවත්වනු ලබන මහාධිකරණයක් විසින් හෝ අද්මිරාල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණයක් විසින් හෝ විභාග කරනු ලැබිය යුතු අතර එවැනි සෑම අධිකරණයකටම මේ පනත මගින් විධිවිධාන සලසා ඇති උපරිම දණ්ඩනය පැනවීමට අධිකරණ බලය තිබිය යුතු ය.

(3) මේ පනතින් හෝ ඒ යටතේ තැනනොත් වෙනත් යම් ප්‍රඥප්තියකින් හෝ ඒ යටතේ විධිවිධාන කිසිවක් හෝ ප්‍රමාණවත් විධිවිධාන හෝ සලසා නැති, යම් බලයක් ක්‍රියාත්මක කිරීම ඇතුළුව යම් කාරණයක්



හෝ ප්‍රශ්නයක් මේ පනත යටතේ පවරන ලද යම් නඩු කටයුත්තක දී උද්ගත වන අවස්ථාවක මේ පනතින් හෝ ඒ යටතේ තැනනොත් වෙනත් යම් ප්‍රඥප්තියකින් හෝ ඒ යටතේ සලසන ලද විධිවිධාන සමග නොගැළපෙන හෝ අනනුකූල නොවන ආඥා කිරීමට හෝ විධාන දීමට අධිකරණයට බලය තිබිය යුතු ය.

49. මේ පනත යටතේ වූ වරදක් සඳහා යන යම් නඩු පැවරීමක දී, සහතිකයේ සඳහන් දූෂණය සිදු කර ඇති බවට සභාපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් සාක්ෂි වශයෙන් ආවේශ කරනු ලැබිය යුතු අතර, එම සහතිකය එහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය. සහතිකයේ සඳහන් සිද්ධිය කරුණු බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු බව.

50. මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වූ සෑම නඩු පැවරීමක් ම නීතිපතිවරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා විශේෂයෙන්ම ලිඛිතව බලය පවරන ලද වෙනත් යම් නිලධරයකු විසින් සිදු කරනු ලැබිය යුතු ය. නඩු පැවරීම කවුරුන් විසින් ද යන වග.

51. (1) නියම කරනු ලැබිය යුතු කරුණු වශයෙන් මේ පනතින් නියමිත කරුණු සහ නියෝග සෑදීමට මේ පනතින් බලය දෙනු ලබන කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත දැක්වෙන සියලු කාර්ය හෝ ඉන් යම් කාර්යයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) අධිකාරිය විසින් අවසරපත්‍ර හෝ බලපත්‍ර නිකුත් කිරීමට අදාළ කොන්දේසි ද ඒ සම්බන්ධයෙන් අයකළ යුතු ගාස්තු ඇත්නම් එකී ගාස්තු ද නිශ්චිතව දක්වමින් ;

(ආ) දූෂණය වැළැක්වීම සඳහා නැව්වල සවි කරනු ලැබිය යුතු උපකරණ වර්ග නිශ්චිතව දක්වමින් ;

(ඇ) ජලයට එකතු කළ විට, ඒ ජලය අපිරිසිදු බවට, අහිතකර බවට, සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ යහපැවැත්මට හානිකර බවට හෝ සමුද්‍ර ජීවීන්ට හානිදායක බවට පත් කිරීමෙන් ඒ ජලය දූෂණය වීමේ ප්‍රතිඵලය ගෙන දෙන, තෙල් හැර වෙනත් ද්‍රව්‍යයන් හෝ ද්‍රව්‍ය පන්තියක් හෝ නිශ්චිතව දක්වමින් ;

(ඈ) තෙල් පිටාර ගලායාමේ හදිසි සැලැස්ම සකස් කොට ඉදිරිපත් කළයුතු ආකාරය සහ ආකෘතිය ද යටත් කරනු ලැබිය යුතු කොන්දේසි නිශ්චිතව දක්වමින් ;

(ඉ) තෙල් හෝ යම් උද්ගාරයක් බැහැර කිරීමේ කාර්ය සඳහා සහ යම් උද්ගාරයක් ශ්‍රී ලංකා දේශීය ජල තීරයට සහ වෙනත් සමුද්‍රීය කලාපයකට හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයට දැමීම වැළැක්වීමේ හෝ අඩු කිරීමේ කාර්ය සඳහා අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ව්‍යාපාරයක්, වෙළෙඳාමක් හෝ කර්මාන්තයක් පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් සවිකළ යුතු බවට නියම කරනු ලැබිය හැකි උපකරණ වර්ග නිශ්චිතව දක්වමින් ;

(ඊ) යම් තැවකින් කරන ලද දූෂක පිට කිරීමක් හේතු කොටගෙන සිදු වූ යම් අනතුරක් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චිතව දක්වමින් ;

(උ) ප්‍රතිග්‍රාහණ පහසුකම් සපයන තැනැත්තන් ලියාපදිංචි කිරීම ඇතුළුව ප්‍රතිග්‍රාහණ පහසුකම් සැලසීම පිළිබඳ කොන්දේසි සහ ඒ සඳහා වැය කිරීමට ඇති ගාස්තු ද නිශ්චිතව දක්වමින් ;

(ඌ) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙහි හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපය හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයේ හෝ අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානවලට අනුකූලව ඛනිජතෙල් මෙහෙයුම් හෝ අදාළ කටයුතු ඇතුළු ස්වාභාවික සම්පත් කැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චිතව දක්වමින් ;

(එ) අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන යම් විධානවලට අනුකූලව ඛනිජතෙල් මෙහෙයුම් හෝ අදාළ කටයුතු ඇතුළු ස්වාභාවික සම්පත් කැනීම හෝ පවත්වාගෙන යන හෝ නියැලී සිටින කොන්ත්‍රාත්කරුවන් සහ මෙහෙයුම්කරුවන් විසින් පවත්වා ගෙන යා යුතු ප්‍රමිතීන් නිශ්චිතව දක්වමින් ;

(ඒ) අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන යම් විධානවලට අනුකූලව අක්වෙරළ හෝ වෙරළ සඳහම් කරගත් ඛනිජතෙල් මෙහෙයුම් සඳහා භාවිත කරනු ලබන උපකරණවල ප්‍රමිතිය, තත්ත්වය නිශ්චිතව දක්වමින් සහ භාවිත කරනු ලබන ජංගම වේදිකා වර්ග සහ වෙනත් අදාළ දූෂණ මර්දන උපකරණ නිශ්චිතව දක්වමින් ;



(ඔ) ආරම්භක සහ අවසාන පාරිසරික පරීක්ෂණ වාර්තාව සකස් කිරීමේ ආකාරය සහ ක්‍රමය ද එම වාර්තාවේ නිශ්චිතව දැක්විය යුතු විස්තර ද එම වාර්තා සකස් කිරීමෙහි නියැලී සිටින තැනැත්තන්ගෙන් අපේක්ෂිත නිර්නායක ද නිශ්චිතව දක්වමින් ;

(ඕ) මෙහෙයුම්කරුවකු විසින් පවත්වාගෙන යනු ලබන දූෂණ මර්දන වාර්තා පොතේ ආකාරය සහ එහි ආකෘතිය ද අන්තර්ගත විය යුතු විස්තර නිශ්චිතව දක්වමින් ;

(ක) තෙල් සහිත ජලය බැහැර කිරීමට අදාළ ජාතික ප්‍රමිතීන් සහ සමුද්‍රීය බැහැරකිරීම්වලට අදාළ කොන්දේසි සහ වයිකාශයිට් පුපුරන ද්‍රව්‍ය භාවිත කිරීමේ දී පිළිපැදිය යුතු කොන්දේසි නිශ්චිතව දැක්වීම ;

(ග) අක්වෙරළ තෙල් ගබඩා කිරීමේ සවිකිරීම් සහ තෙල් ප්‍රවාහන පයිප්ප සහ තෙල් ළිං පිළිබඳව අක්වෙරළ පරීක්ෂණවලට අදාළව කොන්ත්‍රාත්කරුවකු විසින් පිළිපැදිය යුතු නියම සහ කොන්දේසි නිශ්චිතව දක්වමින් සහ තෙල් සහ මුහුදට මුදාහරිනු ලබන තෙල් මිශ්‍රණ බැහැර කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග නිශ්චිතව දක්වමින් ;

(ච) ප්‍රධාන පෙළේ තෙල් ඉහිරීමක් සිදු වූ විට, ගත යුතු ක්‍රියාමාර්ග නිශ්චිතව දක්වමින් සහ දූෂණයවීම පාලනය කිරීම සහ අඩු කිරීම සඳහා භාවිත කළ යුතු තෙල් විසිරවීමේ රසායනික ද්‍රව්‍යයට අදාළ විස්තර ද එම රසායනික ද්‍රව්‍ය භාවිත කරන ආකාරය ද නිශ්චිතව දැක්වීම ;

(ජ) පාරිසරික හානිය සඳහා වන්දි ලබා ගැනීමට භාවිත කළ යුතු ආකෘති පත්‍රය සහ එහි ඇතුළත් කළ යුතු විස්තර හඳුනාගනිමින් ඒවා නියම කරමින් ;

(ට) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙහි හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයක තෙල් කැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චිතව දක්වමින් ;

(ඩ) තෙල් ප්‍රවාහනය කිරීමේ දී සහ වත්කාර් මෙහෙයුම් සිදු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද එම කාර්ය සඳහා බලපත් නිකුත් කිරීමේ දී අයකළ යුතු ගාස්තු ද බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ යම් නියම හා කොන්දේසිවලට යටත්ව ද එම නියම සහ කොන්දේසි ද නිශ්චිතව දක්වමින් ;

(ඣ) මේ පනත යටතේ බලපත් හෝ සහතික නිකුත් කිරීම සඳහා ද වෙනත් යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීම සඳහා ද යම් අත්‍යවශ්‍ය නියාමන කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා ද පනතේ විධිවිධාන යටතේ යම් සේවාවක් සැපයීම සඳහා ද අය කළ යුතු ගාස්තු හෝ අයකිරීම් නියම් කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් යම් පසු දිනක ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු හැකි ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) නියෝගයක් පරිච්ඡින්න කරන ලද දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අධිකාරිය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල

**52**. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් ලිඛිතව අධිකාරියට දෙනු ලැබිය හැකි ය. තව ද, අධිකාරිය ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(2) අධිකාරියේ දේපළ සහ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකෘතියක් අනුව, වාර වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි ය. තව ද ඒ සෑම විධානයක් ම අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) තත් කාර්ය සඳහා ලිඛිතව බලය පවරනු ලබන යම් තැනැත්තකු විසින් අධිකාරියේ සියලු කටයුතු හෝ ඉන් යමක් විමර්ශනය කරනු ලැබ වාර්තා කරනු ලැබීමට අමාත්‍යවරයා විසින් නියමයක් මඟින් නියම කරනු ලැබිය හැකි අතර, ඒ නියමය කරනු ලැබූ විට එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් අධිකාරිය විසින් සලසනු ලැබිය යුතු ය.



වැරදි සහ දණ්ඩන.

**53**. අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක දී හැර, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ තිහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

වියදම් අරමුදලින් ගෙවිය යුතු බව.

**54**. (1) යම් අධිකරණයක් ඉදිරිපිට දී අධිකාරිය විසින් හෝ එයට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරනු ලැබූ යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවනු ලැබූ හෝ අධිකාරිය විසින් අයකර ගනු ලැබූ යම් නඩු ගාස්තුවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් නැතහොත් සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ ඔහුට එරෙහිව යම් අධිකරණයක් ඉදිරිපිට දී පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියේ එම සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා හෝ සභාවේ සාමාජිකයා විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ හෝ සභාවේ විධාන මත කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අදාළ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, එම මුදල එම තැනැත්තා විසින් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබුවහොත් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සහයෝගයෙන් ක්‍රියා කිරීමේ වගකීම.

**55**. (1) ස්ථිර හා ජංගම වේදිකා සහ වෙනත් අදාළ සවිකිරීම් සම්බන්ධයෙන් ඛනිජතෙල් සම්පත් ගිවිසුම යටතේ ඛනිජතෙල් මෙහෙයුම් හෝ අදාළ කටයුතු ඇතුළු ස්වාභාවික සම්පත් කැණීමේ යෙදී සිටින හෝ නියැලී සිටින යම් කොන්ත්‍රාත්කරුවකු, සේවා උප කොන්ත්‍රාත්කරුවකු, මෙහෙයුම්කරුවකු හෝ කැණීම භාරව සිටින තැනැත්තකු හෝ නොකොටක ජොංකාධිපතිවරයකු හෝ යම් උපකරණයක්, නළ මාර්ග, අක්වෙරළ සවිකිරීම් හෝ ගොඩබිම යම් ස්ථානයක් භාරව සිටින තැනැත්තෙක් අධිකාරියට හෝ අධිකාරිය විසින් බලය පවරන ලද යම් තැනැත්තකුට මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ තම කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමට හෝ කිරීමට තමාට ලබා දිය හැකි තමා සතු සියලු සාධාරණ සහාය ලබා දිය යුතු අතර අධිකාරිය හෝ අධිකාරිය විසින් බලය පවරන ලද තැනැත්තාට අවශ්‍ය විය හැකි යම් තොරතුරු ද ලබාදිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ වූ ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය කිරීමෙහි ලා හෝ ඉටුකිරීමෙහි ලා අධිකාරියට හෝ එසේ බලය දෙන ලද යම් තැනැත්තකුට කිසිම තැනැත්තකු විසින් බාධාවක් හෝ අවහිරයක් කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය කිරීමෙහි ලා හෝ ඉටු කිරීමෙහි ලා අධිකාරියට හෝ එසේ බලය දෙන ලද යම් තැනැත්තකුට බාධා කරන හෝ අවහිර කරන යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන්නා වූ දඩයකට යටත් විය යුතු ය.

අධිකාරියේ නිලධරයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

56. අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

57. අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි සම්බන්ධව ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ සහ ඇතැම් නිලධරයන්ගේ වගකීම.

58. මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ වරද සිදු කරන අවස්ථාවේ දී ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා, සාමාන්‍යාධිකාරීවරයා හෝ ලේකම්වරයා හෝ සමාන ධුරයක් දැරූ නිලධරයකු වූ සෑම තැනැත්තෙක් ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන්නේ නම්, වරද සිදු කරන අවස්ථාවේ දී ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තෙක් ම,

වරද සිදු කරන ලද්දේ තමාගේ කැමැත්ත හෝ වංක සහයෝගීතාව ඇතිව නොවන බව ඔප්පු කරනු ලබන්නේ නම් මිස සහ ඔහුගේ කර්තව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගනිමින් සහ සියලු අවස්ථානුගත කරුණු අනුව ඔහු විසින් කළ යුතු ව තිබුණු පරිදි ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා සියලු උද්‍යෝගයෙන් කටයුතු කළ බව ඔහු ඔප්පු කරන්නේ නම් මිස ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.



1981 අංක 59 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත ඉවත් කිරීම.

59. 1981 අංක 59 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

ඉතිරි කිරීම.

60. 1981 අංක 59 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත ඉවත් කිරීම නොතකා—

(1) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරිය වෙත පවරා තිබූ සියලු චංචල හා නිශ්චල දේපළ නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි අධිකාරිය වෙත පවරනු ලැබිය යුතු ය ;

(2) සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරිය විසින් හෝ එය සමග ඇතිකර ගෙන නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි අධිකාරිය විසින් හෝ එය සමග ඇති කර ගත් කොන්ත්‍රාත් සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(3) සමුද්‍රීය දූෂණ වැළැක්වීමේ අධිකාරිය විසින් නිකුත් කොට නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී බලාත්මකව පවතින සියලු අවසරපත්‍ර, අවබෝධතා ගිවිසුම හෝ සංස්ථා අවබෝධතා ගිවිසුම් නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි අධිකාරිය විසින් නිකුත් කරන ලද පිළිවෙලින් අවසරපත්‍ර, අවබෝධතා ගිවිසුම් සහ සංස්ථා අවබෝධතා ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(4) සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරිය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවතින සියලු නඩු සහ නීති කෘත්‍යයන් නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි අවස්ථාවෝචිත පරිදි අධිකාරිය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබූ නඩු සහ නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව දිගටම පවත්වාගෙන ගොස් අවසන් කරනු ලැබිය හැකි ය ;

(5) නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(6) සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරියේ වාසියට හෝ එයට එරෙහිව දෙන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ක්‍රියාත්මක කිරීම අවසන් නොකළ සියලු තඩු තීන්දු සහ ආඥා නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි, අවස්ථාවෝචිත පරිදි අධිකාරියේ වාසියට හෝ එයට එරෙහිව දෙන ලද තඩු තීන්දු සහ ආඥා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය ;

(7) නියමිත දිනයේ දී සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරියේ සියලු සම්බන්ධතා, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ වගකීම් නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි අධිකාරියේ සම්බන්ධතා, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(8) නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරිය විසින් සාදන ලද සියලු රීති හෝ නියෝග නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි අධිකාරියේ රීති හා නියෝග ලෙස සලකනු ලැබිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

61. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*අර්ථ නිරූපනය.*

62. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"වෙනත් යම් දේපළක්" යන්නෙන්, වෙරළ රේඛාවට ස්ථිර වශයෙන් ම සහ අභිප්‍රායිකව සම්බන්ධ කරනු නොලැබූ යම් දේපළක් අදහස් වන අතර, ඊට අවදානමට ලක් වූ නැව් බඩු ඇතුළත් වේ ;

"බත්තල" යන්නෙන්, රුවල්වලින් හෝ යාන්ත්‍රික බලයෙන් වූ ස්වයං ධාවනය කිරීමේ ක්‍රම නැත්තා වූ ද ඇදගෙන යා යුතු වූ හෝ උදම් හෝ ප්‍රවාහයේ බලපෑම යටතේ පාවීමට ඉඩ දෙනු ලැබූ මෙවලක් අදහස් වන අතර, ලයිටරයක් හෝ ඒ සමාන යාත්‍රාවක් ඊට ඇතුළත් වේ ;



"බත්කරීන්" යන්නෙන්, තෙල්, තෙල් ඉන්ධන හෝ යම් තෙල් මිශ්‍රණයක් සමුද්‍රීය පරිසරයේ දී මාරු කිරීම අදහස් වේ ;

"මධ්‍යම පරිසර අධිකාරිය" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගින් පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ ;

"ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව" යන්නෙන්, 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත මගින් පිහිටුවන ලද ඛනිජතෙල් නීතිගත සංස්ථාව අදහස් වේ ;

"වර්ගීකරණ සමාජ" යන්නෙන්, වාණිජ සහ රාජ්‍ය බලපෑම්වලින් ස්වාධීන වූ ද,—

(අ) නැව්වල, සමුද්‍රීය යාත්‍රාවල සහ වෙනත් අක් වෙරළ ඉදිකිරීම්වල ආරක්ෂාව සහ ඉදිකිරීමේ ප්‍රමිති පිළිබඳව;

(ආ) නැව්වල, සමුද්‍රීය යාත්‍රාවල සහ වෙනත් අක් වෙරළ ඉදිකිරීම්වල මෙහෙයුම් පටිපාටි ප්‍රමිතිවල තත්වයන් පවරන ලද වර්ගීකරණ අංකයකින් හා අකුරකින් හඳුන්වමින්,

නිර්ණය කරන හා පළකරන සංවිධාන අදහස් වේ ;

"වෙරළ කලාපය" යන්නට, 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ කලාප පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"හදිසි සැලැස්ම" යන්නෙන්, පරිසර දූෂණ සහ සමුද්‍රීය දූෂණය වීම හෝ දූෂණයට ආසන්න තර්ජනයක් ඇති වීම සිදු කරන කාර්මික ඉදිකිරීමක් ක්‍රියාවිරහිත වීම ඇතුළු හදිසි අනතුරක්, සිද්ධියක්, සිදුවීමක් හෝ අවස්ථාවක් වැනි සමුද්‍රීය හදිසි අවස්ථාවකට අදාළ වෙනත් දූෂණයක් වැළැක්වීම, අඩුකිරීම, නියාමනය කිරීම සහ මර්දනය කිරීම සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර ගෙන දීමේ හැකියා ඇති සංවිධානාත්මක වැඩසටහනක් පවත්වාගෙන යාම ද, ඊට ආශ්‍රිත මුදල් යෙදවීම, උපකරණ සහ පුහුණු වැඩපිළිවෙලවල් කළමනාකරණය කිරීම ද අදහස් වේ ;

"කොන්ත්‍රාත්කරු" යන්නට, 2003 අංක 26 දරන ඛනිජ සම්පත් පනතේ ඊට දී ඇති අර්ථයම වන්නේ ය ;

"වෙළෙඳ නැව් අධ්‍යක්ෂක" යන්නෙන්, 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද නිලධාරියා අදහස් වේ ;

"පිටකිරීම" යන්නට, හානිකර ද්‍රව්‍ය හෝ ඒ ද්‍රව්‍යවල අපද්‍රව්‍ය නික්මයාම සම්බන්ධයෙන් වන විට එම පිටකිරීම යන්නෙන්, නැවකින් හෝ වෙනත් යම් මූලාශ්‍රයකින් කවර හෝ ආකාරයෙන් සිදු විය හැකි යම් මුදා හැරීමක් අදහස් වන අතර, ඊට යම් පිටවීමක්, බැහැරකිරීමක්, පිටාර ගැලීමක්, කාන්දුවීමක්, පිරවීමක්, පිටකිරීමක් හෝ හිස් කිරීමක් ද ඇතුළත් වේ ;

"ඉවත දැමීම" යන්නෙන්, යම් ද්‍රව්‍යයක් හෝ වෙනත් යම් අපද්‍රව්‍යයක් හිතාමතාම මුහුදට බැහැර කිරීම අදහස් වන අතර දැමීම, විසිකිරීම, හෙළීම හෝ නැත්පත් කිරීම අදහස් වන අතර "ඉවත දැමීම" යන යෙදුම ඒ අනුව තේරුම් ගත යුතු වේ;

"පරිසරය" යන්නෙන්, ඉඩම්, පස, ජලය, වායුගෝලය, දේශගුණය, ශබ්ද, ගඳ-සුවඳ, රස සහ සැම විස්තරයකටම අයත් සත්ත්වයන් සහ ශාකවල ජීව විද්‍යාත්මක කරුණු ඇතුළත්ව මනුෂ්‍යයන්ගේ වටාපිටාවේ ඇති භෞතික කරුණු අදහස් වේ ;

"පෙර වෙරළ" යන්නෙන්, මධ්‍ය වඩදිය රේඛාව සහ මධ්‍යම බාදිය අතර වූ මුහුදු තීරයේ වෙරළ ප්‍රදේශය අදහස් වේ ;

"හානිකර ද්‍රව්‍ය" යන්නෙන්, එවැනි ද්‍රව්‍යයක් මුහුදට දමනු ලැබුවහොත් මිනිසුන්ගේ සෞඛ්‍යයට අනතුරක් සිදුවීමට ඉඩ ඇති හෝ ජීව මූලාශ්‍රවලට සහ සමුද්‍රීය ජීවීන්ට හානිකර විය හැකි උපකරණවලට අලාභ සිදුවිය හැකි හෝ නෛතික ලෙස මුහුද භාවිත කරන වෙනත් අවස්ථාවල බලපෑම් සිදුවිය හැකි යම් ද්‍රව්‍යයක් අදහස් වන අතර, ඊට මේ පනත මගින් පාලනය කරනු ලබන යම් ද්‍රව්‍යයක් ද ඇතුළත් වේ ;

"උසස් අධ්‍යාපන ආයතන" යන්නට, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"සිද්ධිය" යන්න, දූෂණ හානියක් සම්බන්ධයෙන් වන විට "සිද්ධිය" යන්නෙන් හානිය සිදු කරන්නා වූ යම් සිදුවීමක් හෝ එකම ප්‍රභවයක් ඇති යම් සිදුවීම් පෙළක් අදහස් වේ ;



"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, හෝ ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියක් හෝ නීතියක් යටතේ ඇති කරන ලද හෝ පිහිටුවන ලද කවර වූ හෝ යම් අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"මධ්‍ය වඩදිය" යන්නෙන්, මධ්‍ය මුහුදු මට්ටම් රේඛාවේ ධන මීටර් +06 ක් අදහස් වේ ;

"මධ්‍ය බාදිය" යන්නෙන්, මධ්‍ය මුහුදු මට්ටමේ සිට සෘණ මීටර් -06 අදහස් වේ ;

"සමුද්‍රීය පරිසරය" යන්නෙන්, මනුෂ්‍යයන්ගේ වටාපිටාව පිළිබඳ සාධක සහ පනත මගින් අර්ථ නිරූපණය කර ඇති පරිදි සමුද්‍රීය පාරිසරික පරිපථය තුළ ඉඩම්, තෙල්, ජලය, වාතාශ්‍රය, කාලගුණය, ශබ්ද, ගඳ සුවඳ සහ රස ඇතුළත් සත්වයන් කෙරෙහි සහ සෑම ශාක පිළිබඳ සෑම විස්තරයක් කෙරෙහි බලපාන්නා වූ ජීව විද්‍යා කර්තව්‍ය අදහස් වේ ;

"සමුද්‍රීය හදිසි අවස්ථාව" යන්නෙන්, කවරාකාරයකින් සිදු වුවත් තෙල් හේතුකොටගෙන සමුද්‍රීය පරිසරය විශාල ලෙස අපවිත්‍රවීම හෝ සමුද්‍රීය පරිසරය විශාල ලෙස අපවිත්‍රවීමේ නිසැක තර්ජනයක ප්‍රතිඵලය වන්නා වූ යම් හදිසි අනතුරක්, සිද්ධියක්, සිදුවීමක් හෝ තත්වයක් අදහස් වේ ;

"සමුද්‍ර විපත" යන්නෙන්, නැව්වල ගැටුමක් හෝ වෙරළේ වැදීමක් හෝ යාත්‍රා කිරීමේ දී වන්නා වූ වෙනත් සිද්ධියක් හෝ නැවක හෝ ඉන් බාහිරව ඇති වන වෙනත් සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් නැවකට හෝ නැව් බඩුවලට ද්‍රව්‍යමය හානියක් හෝ ද්‍රව්‍යමය හානියක්වීමේ ආසන්න තර්ජනයක් ඇති වෙනත් සිද්ධියක් අදහස් වේ ;

"සමුද්‍රීය කලාප" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනත යටතේ ප්‍රකාශනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද-

(අ) යාබද කලාප ;

(ආ) අනන්‍ය ආර්ථික කලාප ;

(ඇ) මහාද්වීපික තටාකය ; සහ

(ඈ) දූෂණ වැළැක්වීමේ කලාපය,

යන කලාප ඇතුළත් වන අතර, එකී පනත යටතේ මතු යම් දිනයක දී ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි වෙනත් යම් කලාපයක් ද ඊට ඇතුළත් වේ ;

යම් නැවකට අදාළව "නෞකාධිපතිවරයා" යන්නට, නැව් කප්පිත්තා හැර තත්කාලයේ එම නැවේ අණදීම, භාරකාරත්වය හෝ පාලනය ඇති සෑම තැනැත්තෙකුම ඊට ඇතුළත් වේ;

"විෂ සහිත ද්‍රාවණ" යන්නෙන්, 1978 ප්‍රටෝකෝල් (මාපෝල් 73/78) මගින් සංශෝධිත 1973 නැව් වලින් සිදුවන දූෂණය වැළැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ II ඇමුණුමේ II වන පරිශිෂ්ඨයේ නම් කර ඇති යම් ද්‍රව්‍යයක් හෝ මාපෝල් 73/78 ලේඛනයේ 3(4) නියෝගයේ ඒ. බී. සී. හෝ ඩී වර්ගවලට අයත් බවට එකී නියෝගයේ විධිවිධාන යටතේ තාවකාලිකව තක්සේරු කර ඇති ද්‍රව්‍යයක් අදහස් වේ;

"පදිංචිකරු" යන්නෙන්, ස්ථානයක හෝ ඉඩමක සැබැවින්ම පදිංචිව සිටින තැනැත්තා හෝ එවැනි තැනැත්තකු නැති නම් එහි අයිතිකරු අදහස් වේ ;

"අක්වෙරළේ ඉදිකිරීම" යන්නට-

(අ) ශ්‍රී ලංකා දේශිය ජලතීරයේ සහ මුහුදු පත්ලෙහි සහ යටි පසෙහි හෝ මුහුදු පත්ල සහ යටි පස මත හෝ මුහුදු පත්ලට සහ යටි පසට ඉහළින් ඉදිකරන ලද, පිහිටුවන ලද, තබන ලද හෝ පාවිච්චි කරන ලද (ස්ථිර වූ හෝ තාවකාලික වූ) හෝ සමුද්‍රීය කලාපයේ හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයක හෝ එය මත භාවිත කරන ලද යම් ඉදිකිරිමක් හෝ උපකරණයක් ;



(ආ) මහාද්වීපික තටාකයේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම සම්බන්ධයෙන් එහි මුහුද පත්ලෙහි සහ යටි පසෙහි හෝ මුහුදු පත්ල මත සහ යටි පසට ඉහළින් ඉදිකරන ලද, පිහිටුවන ලද, තබන ලද හෝ පාවිච්චි කරන ලද (ස්ථිර වූ හෝ තාවකාලික වූ හෝ) යම් ඉදිකිරීමක් හෝ උපකරණයක් ;

(ඇ) ශ්‍රී ලංකා දේශිය ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයක හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයක මුහුදු පත්ලෙහි හෝ අක්වෙරළෙහි හෝ නැංගුරම් ලා තිබෙන හෝ සම්බන්ධ කොට තිබෙන, නැතහොත් මහාද්වීපික තටාකයේ ස්වභාවික සම්පත් ගවේෂණය කිරීම සහ උපයෝජනය කිරීම සම්බන්ධයෙන් මහාද්වීපික තටාකයට ඉහළින් වූ ජලය පත්ලෙහි නැංගුරම් ලා තිබෙන (නැවක් නොවන) දිය මත පාවෙන යම් දෙයක් ;

(ඈ) යම් විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දේශිය ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයක හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයක හෝ මහාද්වීපික තටාකයේ මුහුදු පත්ලෙහි සහ යටි පසෙහි හෝ මුහුදු පත්ලට හෝ යටි පසට ඉහළින් ඉදිකරන ලද, පිහිටුවන ලද, තබන ලද හෝ පාවිච්චි කරන ලද යම් ඉදිකිරීමක් හෝ උපකරණයක් ;

"තෙල්" යන්නෙන්, ව්‍යාප්ත වීම සීමා නොකර කවර හෝ ස්වරූපයකින් වූ ඛනිජතෙල්, අදහස් වන අතර, ඊට බොරතෙල්, ඉන්ධන තෙල්, රොන්මඩ තෙල් සහ පිරිසිදු කරන ලද නිෂ්පාදන අදහස් වේ ;

"තෙල් ඉන්ධන" යන්නෙන්, ඒ තෙල් රැගෙන යනු ලබන නැව්වල ධාවනය සහ උපකාරක යන්ත්‍රවලට අදාළව ඉන්ධන වශයෙන් භාවිත කරනු ලබන යම් තෙල් වර්ගයක් අදහස් වේ ;

"තෙල් මිශ්‍රණ" යන්නෙන්, තෙල් අන්තර්ගත මිශ්‍රණයක් අදහස් වේ ;

"ක්‍රියාකරවන්නා" යන්නට, නැවක් සම්බන්ධයෙන් වන විට නැව කුලියට ගනු ලැබුවේ කාලය අනුව වුව ද යාත්‍රා ගමන අනුව වුව ද පවරා දීමක් මගින් වුව ද නැව කුලියට ගන්නා ඇතුළත් වේ ;

"අයිතිකරු" යන්නෙන්, අයිතිකරු වශයෙන් ලියාපදිංචි වූ තැනැත්තා හෝ ලියාපදිංචි කිරීමක් නොමැති විට, අයිතිය හෝ සන්තකය ඇති තැනැත්තා අදහස් වේ ;

"ඛනිජ සම්පත් බලපත්‍රය" යන්නට, 2003 අංක 26 දරන ඛනිජ සම්පත් පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"නළ මාර්ගය" යන්නට, විවෘත සහ සංවෘත නල මාර්ග ද, තෙල් කුණාටු ජලය, මල අපද්‍රව්‍ය සහ වෙනත් දූෂක ද්‍රව්‍ය ගෙන යාම සඳහා භාවිත කරනු ලබන ස්වාභාවික හෝ කෘත්‍රිම (මිනිසා විසින් සාදන ලද) සියලු නල මාර්ග ඇතුළත් වේ ;

"දූෂක ද්‍රව්‍යය" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා දූෂක ද්‍රව්‍යයක් ලෙසට අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ යම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය පන්තියක කොටසක් වන යම් ද්‍රව්‍යයක් අදහස් වන අතර, භාණ්ඩික අපද්‍රව්‍ය සහ යම් ප්‍රතිලාභී භාවිතයකට අහිතකර ලෙස බලපාන හෝ අනාගතයේ දී අහිතකර විය හැකි බලපෑමක් ඇති කරවන පරිදි ලැබෙන පරිසරයේ යම් කොටසක හෝ ද්‍රව්‍ය මූලයක ගුණාත්මකභාවය වෙනස් කරන ද්‍රව වශයෙන් හෝ ඝන වශයෙන් හෝ වායු වශයෙන් එම ද්‍රව්‍ය සමග හැවරී ඇති යම් අපද්‍රව්‍යයක් ද ඊට ඇතුළත් වේ;

"දූෂණය" යන්නෙන්, පරිසරය වැඩදායි ලෙස උපයෝගී කර ගැනීමට අහිතකර ලෙස හෝ මහජන සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සුභසාධනයට නැතහොත් සතුන්ට, කුරුල්ලන්ට, වනජීවීන්ට, ජලජ ජීවීන්ට හෝ සෑම විස්තරයකටම අයත් ශාකවලට උපද්‍රවකාරී හෝ අනතුරුදායක විය හැකි තත්ත්වයක් ඇති කරවන හෝ මසුන් ඇල්ලීම සහ මුහුදෙන් ලැබෙන වෙනත් නීත්‍යානුකූල භාවිතයන් ඇතුළු සමුද්‍රීය කටයුතුවලට බාධාවක් ඇති කරවන සහ මුහුදු ජලය භාවිත කිරීමේ තත්ත්වයන්ට බාධාකරන පරිදි මිනිසා විසින් කෙලින් ම හෝ අනාහාරයකින් යම් ද්‍රව්‍යයක් හෝ ශක්තියක් සමුද්‍රීය ජීවිතයට ඇතුළත් කිරීම ඇතුළු අපද්‍රව්‍ය බැහැර කිරීම, පිට කිරීම හෝ තැන්පත් කිරීම මගින් සමුද්‍රීය පරිසරයේ යම් කොටසක භෞතික, තාප, රසායනික, ජෛවී හෝ විකිරණශීලී පදාර්ථයන් කෙලින් ම හෝ අනාහාරයකින් වෙනස් කිරීම අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ ;



"බේරාගැනීම" යන්නෙන්, නැව් ගමන් කළ හැකි ජලයේ හෝ වෙනත් යම් ජලයක අනතුරට පත් වී ඇති යම් නැවක හෝ වෙනත් දේපළකට සහායවීමෙහි ලා සිදු කරනු ලබන යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අදහස් වේ ;

"නැව" යන්නෙන්, සමුද්‍රීය පරිසරයක යාත්‍රා කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් යාත්‍රාවක් හෝ බෝට්ටුවක් හෝ ජලරක්ෂක බෝට්ටු, වාත කොට්ට වාහන, නිමග්න කළ හැකි යාත්‍රා, පාවෙන යාත්‍රා සහ සවිකරන ලද හෝ පාවෙන පරීක්ෂණ වේදිකා සහ ගබඩා ඒකක අදහස් වන අතර, ඊට සමුද්‍රීය පරිසරයක යාත්‍රා කිරීමට සහ නැවක කටයුතු සිදු කිරීමට අවශ්‍ය වන (ආහාර සැපයීම හැර) සියලු උපකරණ, ඇතැලුම් සහ උපාංග ද ඇතුළත් වේ ;

"ශ්‍රී ලංකා දේශීය ජල තීරය" යන්නට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය;

"පර්යන්තය" යන්නෙන්, නැව් නිෂ්පාදනය කරන, නැවක නිෂ්පාදනය කරන, අළුත්වැඩියා කරන, තෙල් පුරවන, ප්‍රතිසංස්කරණය කරන හෝ කඩා වෙන් කරන ජෙටියක්, ගොඩ බසින පාලමක්, අංගනයක් හෝ නිර්ජල නැව් තටාකාංගනයක් (එහි පරිශ්‍රය ඇතුළු), යම් පර්යන්තයක් අදහස් වේ;

"මාරු කිරීම" යන්නෙන් තෙල් හෝ යම් දූෂක ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් වන විට, තොග වශයෙන් මාරු කිරීම අදහස් වේ;

"විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.